**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව**

**இலங்கை தேசிய மனிதவள அபிவிருத்தி சபை**

**NATIONAL HUMAN RESOURCES DEVELOPMENT COUNCIL OF SRI LANKA**

# වාර්ෂික වාර්තාව

# ஆண்டு அறிக்கை

# ANNUAL REPORT

# 2013

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

இளைஞர் அலுவல்கள் மற்றும் திறன் அபிவிருத்தி அமைச்சு

MINISTRY OF YOUTH AFFAIRS & SKILLS DEVELOPMENT

354/2, නිපුණතා පියස, 7 වන මහල, ඇල්විටිගල මාවත, කොළඹ 05

354/2, 7 ஆம் மாடி, நிபுனதா பியச, எல்பிடிய மவாத்தை கொழும்பு - 05

354/2, NIPUNATHA PIYASA, 7TH FLOOR, ELVITIGALA MAWATHA, COLOMBO 05.

**ආයතනික පසුබිම**

| | | |
|---|---|---|
| ආයතනය | : | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව |
| අමාත්‍යාංශය | : | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය |
| ලිපිනය | : | 354/2, 7වන මහල, නිපුණතා පියස, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 |
| ඊ මේල් ලිපිනය | : | chairmannhrdc@yahoo.com |
| වෙබ් අඩවිය | : | www.nhrdc.gov.lk |
| දුරකථන අංකය | : | 0112595680 |
| ෆැක්ස් | : | 0112595680 |
| බැංකු කරුවන් | : | ලංකා බැංකුව<br>මහජන බැංකුව |

## සභාපතිතුමාගේ ප්‍රකාශය

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව සංස්ථාපනය කල දින පටන් ගතවූ කාලය තුල ක්‍රියාකාරිත්වය හා සැසඳීමේදී 2013 වර්ෂය එම ආයතනයෙහි හැරවුම් මංසන්ධියක් සළකුණු කළ වර්ෂයක් ලෙස හැඳින්විය හැක. 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතින් මෙම සභාව සංස්ථාපනය කර ඇත්තේ ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා රජයට සහායවීම සඳහා වුවද ඒ සඳහා හැකියාව ඇති සුදුසු කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම ඇරඹෙන්නේ 2013 වර්ෂයේ ජුනි මාසයේ සිටය. වරින්වර කොන්ත්‍රාත් පදනම යටතේත් තාවකාලික පදනම යටතේත් උපදේශකවරු ලෙසත් බඳවාගත් කාර්ය මණ්ඩලයක් මෙම ආයතනය තුල සිය කාර්ය භාරය ඉටුකර ඇති අතර 2013 ජනවාරි මාසය වන විට සිටියේ ස්ථිර කාර්ය මණ්ඩලය 9 දෙනෙක් වන අතර ඉන් සිවු දෙනෙක්ම කණිෂ්ඨ කාර්ය මණ්ඩලයට අයත් විය. මෙම තත්ත්වය තේරුම්ගත් අප 2013 වර්ෂයේදී ආයතනයේ ඉලක්ක හා පරමාර්ථ කරා යා හැකි ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සහිත සේවක සංඛ්‍යාවක් හා බඳවා ගැනීමේ පරිපාටියක් අනුමත කරවාගෙන ඒ අනුව 2013 ජුනි මාසය වන විට 30 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් ස්ථිර සේවකයන් ලෙස බඳවා ගන්නා ලදි. ඒ යටතේ ආයතනයට අධ්‍යක්ෂවරයෙක් හා සහකාර අධ්‍යක්ෂවරු තිදෙනෙක් බඳවාගත් අතර පර්යේෂණ නිලධාරින් හා සංවර්ධන නිලධාරින් අටක්ද බඳවාගන්නා ලදි.

රාජ්‍ය සේවයට නවකයන්වූ මේ සියළු දෙනාගේම ධාරිතා වර්ධන අවශ්‍යතා හඳුනාගෙන මානව සම්පත් සංවර්ධනයට අදාල විවිධ විෂයයන් ඔස්සේ පුහුණු වැඩමුළු සංවිධානය කළ අතර එම වැඩමුළු සඳහා යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ හා එම අමාත්‍යාංශය යටතට ගැනෙන අනිකුත් ආයතන 16 හි කාර්ය මණ්ඩල සඳහාද සහභාගී වීමට අවස්ථාව ලබා දුනිමු.

විශේෂයෙන්ම සමීක්ෂණ අධ්‍යයන හා පර්යේෂණ පැවැත්වීමටත් සංවර්ධන ව්‍යාපෘතීන් සැළසුම් කිරීමටත් එමෙන්ම ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි වලටත් අදාල මෙම පුහුණුව තුළින් අපගේ කාර්ය මණ්ඩලය ඉතා කෙටිකලකින්ම පරිණත බුද්ධියෙන් හෙබි කාර්ය මණ්ඩලයක් බවට පත්විය.

තවද, මෙම ආයතනය සංස්ථාපනය කරන ලද පනතින් අපේක්ෂිත කාර්ය භාරය වටහාගෙන ඒ අනුව පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතින් සංවිධානය කරන ලදි. ඉදිරි පර්යේෂණයන් සඳහා එසේ සැළසුම්කල ව්‍යාපෘති ඇසුරෙන් සංයුක්ත සැළැස්මක් සකස්කර එහි අන්තර්ගත දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා හඳුනාගත් මෙහෙවර ඉටුකිරිම සඳහා 2013 ක්‍රියාත්මක සැළැස්ම සකස්කරන ලදි. මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් ලෙස වෙන් කෙරුණ රුපියල් මිලියන 16ක මූලා සීමාව යටතේ පහත සඳහන් ක්‍රියාකාරි සැළැස්ම සකස්කරන ලදි.

මෙම සැළැස්මේ ව්‍යාපෘතීන් තෝරා ගැනීමේදී අදාල පනතේ සඳහන් කාර්යයන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වන ලදි. පනතේ 14.1 වගන්තියෙන් දක්වා ඇති ප්‍රධාන ක්ෂේත්‍රයන් අනාවරණය වන පරිදි ව්‍යාපෘතීන් හඳුනාගතිමු.

<u>ප්‍රධාන ක්ෂේත්‍රයන්</u>

(a) රැකීරක්ෂා, පුහුණුව සහ අධ්‍යාපනය
(b) විද්‍යාව සහ තාක්ෂණය උපයෝගී කර ගැනීම
(c) ජීවන තත්වය නංවාලීම
(d) අවාසිකර තැනැත්තන්ගේ කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂාව සැලසුම් කිරීම
(e) ආර්ථික ප්‍රතිසංස්කරණ මගින් හිමිකම් රැකදීම සම්බන්ධයෙන් වන හෝ අදාළ වන මානව සම්පත් ඛණ්ඩ පරිමේය කිරීම සහ සමෝධානය කිරීම

<u>රැකීරක්ෂා, පුහුණුව සහ අධ්‍යාපනය</u>

මේ අතර රැකීරක්ෂා, පුහුණුව සහ අධ්‍යාපනය යන පුළුල් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විශේෂයෙන්ම උසස් අධ්‍යාපන වරම් නොලබන පාසැල් හැර යන දරු දැරියන් වෘත්තීය අධ්‍යාපනයට යොමුකිරීම සඳහා පාසැල් හැර යන දරු දැරියන් වෙනුවෙන් දැනුවත් කිරිමේ වැඩ සටහන් මාලාවක් විවිධ වෘත්තීය පුහුණු ආයතනවල උපකාරය ඇතිව පවත්වන ලදි. ඒ අනුව විශේෂයෙන්ම උතුරු නැගෙනහිර පලාත්ද ආවරණය වන පරිදි මඩකලපුව, අම්පාර, මාතර, කෑගල්ල, රත්නපුරය, පුත්තලම, කුරුණෑගල යන දිස්ත්‍රික්කයන්හි එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි.

උපාධිධාරීන් සේවා නියුක්ත කිරීම සඳහා රජය අනුගමනය කරන ක්‍රමවේදය හා ප්‍රතිපත්තිය පිළිබඳවද අධ්‍යයනයක් කර වාර්ථාව රජයට භාර දී ඇත. උපාධිධාරි අභ්‍යාස යෝජනා ක්‍රම යටතේ විවිධ රජයන් විවිධ අවස්ථා වලදී විවිධ ප්‍රමාණයන්ගෙන් උපාධිධාරීන් රාජ්‍ය සේවයට බඳවා ගන්නා ලදි. මෙසේ බඳවා ගැනීමේදී අනුගමනය කරන ලද ප්‍රතිපත්තියෙහි ඵලදායිතාවය මැන බැලීම මෙම අධ්‍යනයෙහි පරමාර්ථය වන අතර ඉන් ලබාගත් නිර්දේශ හා නිගමනයන් රජයට ගරු විෂයභාර අමාත්‍යතුමා මගින් ඉදිරිපත් කර ඇත.

<u>පොදු වෘත්තීය මාර්ගෝපදේශණ වැඩපිළිවෙලක්</u>

වෘත්තීය මාර්ගෝපදේශණය පාසැල් සිසුන් සඳහාත්, පාසැල් හැර ගිය සිසුන් සඳහාත්, විශ්ව විද්‍යාල සිසුන් සඳහාත් අත්‍යවශ්‍යය. අනාගතයේ තමන් තෝරාගත යුතු වෘත්තීයට අදාල පරිදි අධ්‍යාපනය හා නිපුණතා සංවර්ධන පාඨමාලා තෝරා ගැනීමට ඒ මගින් සිසුනට අවස්ථාව සැලසේ. එහෙත් දැනට

වෘත්තීය පුහුණු ආයතන තම තමන්ට ආවේනික වෘත්තීය මාර්ගෝපදේශ වැඩ සටහන් ක්‍රියාත්මක කරන අතර අධ්‍යාපන අමාත්‍යාංශය පාසැල් තුල ක්‍රියාත්මක කරන වැඩ සටහන් ඊට හාත්පසින්ම වෙනස්ය. මේ නිසා නිසි වෘත්තීය මාර්ගෝපදේශණයක් නොලැබෙන බව වටහාගත් අප සියල්ලන්ටම පොදු වෘත්තීය මාර්ගෝපදේශණ වැඩසටහනක් සකස්කර ගරු අමාත්‍යතුමා මගින් රජයට ඉදිරිපත් කිරීමද 2013 වර්ෂයේදී සිදු කරන ලදි.

## පාසැල් හැරගිය සිසුන් පිළිබඳ සමීක්ෂණය

විවිධ හේතු මත පාසැල් සිසුන් පාසැල් හැර යන බව අපි දනිමු. ඒ සඳහා විසඳුමක් සෙවීමට නම් මෙම හේතුන් පිළිබඳ නිවැරදි අධ්‍යනයක් කල යුතු බව තේරුම්ගත් අප පාසැල් හැරගිය සිසුන් වෘත්තීය අධ්‍යාපනයට යොමුකිරීමේ වැඩසටහන් වලට සහභාගීවූ සිසුන් සම්බන්ධ කරගෙන ඒ පිළිබඳ අධ්‍යනයක් සිදුකර අදාල තත්ත්වය ගරු අමාත්‍යතුමන් මගින් රජයට ඉදිරිපත් කර ඇත.

## යුද්ධයෙන් හානියට පත් පවුල් පිළිබඳ සමීක්ෂණය

අප ආයතනය සංස්ථාපනය කරන ලද පනතේ 14 (1) වගන්තියෙන් හඳුනාගෙන ඇති ක්ෂේත්‍ර 5 න් එකක් වන්නේ අවාසි සහගත තත්ත්වයට පත් සමාජ කණ්ඩායම් සඳහා අධ්‍යනයන් පවත්වා රජයට යෝජනා ඉදිරිපත් කිරීමයි. මේ යටතේ විශේෂයෙන්ම අපගේ ගරු අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මැතිතුමාගෙන් ලද උපදෙස් පරිදි අප කිලිනොච්චි දිස්ත්‍රික්කයේ යුද්ධයෙන් මව/පියා/දෙදෙනාම අහිමි පවුල් පිළිබඳ අධ්‍යයනයක් සිදුකරන ලදි. මෙම ඉලක්ක කණ්ඩායම් අයත් පවුල් 7500 ක් පමණ ඇති බව ද්විතියික දත්ත මගින් තහවුරු කරගත් අප සමීක්ෂණය සඳහා ප්‍රශ්ණාවලියක් සූදානම් කර එම දිස්ත්‍රික්කයේ රාජ්‍ය සේවකයන්ට පුහුණුවක් ලබාදුනි. ඔවුන් මගින් එම සමීක්ෂණය පැවැත්විමු. හඳුනාගත් පවුල් 7500 ක් 6704 ක් ම අපගේ ප්‍රශ්ණාවලිය සඳහා ප්‍රතිචාර දක්වා තිබීම තුල එහි සාර්ථකත්වය පිළිබිඹු විය. ඒ ඒ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන්ගෙන් හඳුනාගත් පවුල් සංඛ්‍යාව හා ප්‍රතිචාර දැක්වූ පවුල් ප්‍රමාණය පහත දැක්වේ.

| ප්‍රශ්නාවලි වර්ගය | පුනකරින් | පච්චිලෙයිපලෙයි | කන්ඩාවලී | කරච්චි | මුළු ගණන |
|---|---|---|---|---|---|
| කුඩා | 771 | 504 | 1352 | 3406 | 6033 |
| ලොකු | 182 | 182 | 83 | 222 | 671 |
| මුළු ගණන | 953 | 688 | 1435 | 3628 | 6704 |

මෙම සමීක්ෂණය මගින් ලබාගත් සියළු දත්ත SPSS වැඩසටහන මගින් විශ්ලේෂණය කර ලබාගත් නිරීක්ෂණයන් යළි ප්‍රජාව වෙත ඉදිරිපත්කර ඔවුන්ගේ අදහස් ලබාගන්නා ලදි. ඊට අතිරේකව කිලිනොච්චි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් ඇතුළු රාජ්‍ය නිලධාරින් වෙත ඉදිරිපත්කර ඔවුන්ගේ අදහස් ලබාගන්නා ලදි. අවසාන වශයෙන් අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු ඉහල මට්ටමේ රාජ්‍ය නිලධාරින් ඉදිරිපත්කර ඔවුන්ගේ නිරීක්ෂණ ලබාගෙන අවසන් වාර්ථාව සකස්කර ගරු අමාත්‍යතුමා මගින් රජයට ඉදිරිපත්කර ඇත.

<u>දැයට කිරුළ ප්‍රදර්ශණය</u>

2014 වර්ෂයේ දැයට කිරුළ ප්‍රදර්ශණය කුරුණෑගල දිස්ත්‍රික්කයේ පැවැත්වීම රජය කටයුතු සංවිධානය කරන ලද අතර ඒ වෙනුවෙන් කුරුණෑගල, පුත්තලම හා කෑගල්ල දිස්ත්‍රික්කයන්හි සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කරන ලදි. ඒ යටතේ  පහත සඳහන් වැඩ සටහන් අප ක්‍රියාත්මක කළෙමු.

**(අ) ආකල්ප වර්ධන වැඩසටහන**

රාජ්‍ය සේවය තුළ දක්නට ලැබෙන මන්දගාමී ස්වරූපය ඉවත්කර සේවාලාභී සත්කාරය කෙරේ වඩාත් යොමුවූ රාජ්‍ය සේවකයින්  ඇති කිරීම සඳහා රාජ්‍ය සේවකයින් ඇති කිරීම සඳහා රාජ්‍ය සේවකයින් සඳහා ආකල්ප වර්ධන වැඩ සටහන් 3ක් දිස්ත්‍රික්ක 3 සඳහා ක්‍රියාත්මක කරන ලදි. මේ යටතේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ පූර්ණ අධික්ෂණය යටතේ පුත්තලම දිස්ත්‍රික් ලේකම්වරයා විසින් හලාවත නගරය කේන්ද්‍ර කර ගනිමින් රජයට අළුතින් බඳවාගන්නා ලද උපාධිධාරින් 200 ක්  පමණ පිරිසක් සඳහා එක්දින වැඩසටහනක් සංවිධානය කරන ලදි. එසේම කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොල නගරය කේන්ද්‍ර කරගනිමින් වාරියපොල ප්‍රාදේශීය ලේකම්වරයාගේ සංවිධායකත්වයෙන් රාජ්‍ය සේවාවේ විවිධ මට්ටම්වල නිලධාරින් 200 ක පමණ පිරිසක් සඳහා එක්දින පුහුණු වැඩසටහනක් සංවිධානය කරන ලදි. සබරගමු පලාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ මෙහෙයවීම යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ විදුහල්පතිවරුන් ඇතුළු අධ්‍යාපන පරිපාලන සේවාවේ නිලධාරින් සඳහා එක් දින වැඩමුළුවක් පවත්වන ලදි. මේ සෑම වැඩසටහනක් අවසානයේම සහභාගීවන්නන්ගේ ප්‍රතිචාර ලබාගත් අතර එක් දින වැඩසටහනක් තුළින් බොහෝ සේවකයන්ගේ ආකල්පයන්හී ධනාත්මක වර්ධනයක් සිදුවී ඇති බව සනාථ විය.

**(ආ) පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන්**

මෙම දිස්ත්‍රික්ක 3 හි තෝරාගත් පාසැල් කිහිපයක පහත සඳහන් වැඩ සටහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි.

1. දැයට කිරුළ වැඩසටහනට සමගාමීව ග්‍රාමීය පාසල් දරුවන්ගේ කායික හා මානසික සෞඛ්‍ය නංවාලීමේ වැඩසටහන

    i. මාබෝපිටිය මහා විද්‍යාලය, කෑගල්ල දිස්ත්‍රික්කය
    ii. කාමෙල් බාලිකා විද්‍යාලය, පුත්තලම දිස්ත්‍රික්කය
    iii. වටරැක මහා විද්‍යාලය, කුරුණෑගල දිස්ත්‍රික්කය

2. දැයට කිරුළ වැඩසටහනට සමගාමීව නාගරික පාසල් දරුවන්හට සයිබ අවකශයේ ඇති භයානක පැතිකඩ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

    i. ස්වර්ණ ජයන්ති මහා විද්‍යාලය, කෑගල්ල දිස්ත්‍රික්කය
    ii. කාමෙල් බාලිකා විද්‍යාලය, පුත්තලම දිස්ත්‍රික්කය
    iii. වටරැක මහා විද්‍යාලය, කුරුණෑගල දිස්ත්‍රික්කය

**විද්යුත් ලේඛන ක්‍රමයක් හා දත්ත පද්ධතියක් හඳුන්වාදීම**

අප ආයතනය සංස්ථාපනය කළ පනතේ 16(2) (ඊ) වගන්තිය පරිදි මානව සම්පත් සංවර්ධනයට අදාල දත්ත පද්ධතියක් පවත්වා ගත යුතුය. ඒ අනුව විශේෂයෙන්ම පාසැල් හැරයන සියළු දරු දැරියන්ව ලියා පදිංචි විය හැකි දත්ත පද්ධතියක් www.nhrdc.gov.lk/ නමින් ආරම්භ කරන ලදි. මෙම දත්ත පද්ධතිය තුල ලියාපදිංචිවන දරු දැරියන්ට ඒ මගින් වෘත්තීය පුහුණුවක් හෝ රැකියාවක් සොයා ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලැබෙන අතර වෘත්තීය පුහුණු ආයතන වලට අමතර ප්‍රචාරණ පිරිවැයකින් තොරව වෘත්තීය පුහුණුව සඳහා සිසුන් තෝරාගත හැක. එසේම තනතුරු පුරප්පාඩු සඳහා යෝග්‍යතම අයදුම්කරුවන් මේ මගින් තෝරාගැනීමට රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයටම අවස්ථාව සැලසේ. දිවයිනේ පාසැල් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධ කරගෙන පාසැල් හැරගිය සියළු තරුණ තරුණියන් මෙම දත්ත පද්ධතිය තුළ ලියාපදංචි කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

තොරතුරු තාක්ෂණය දිනෙන් දින ඉහළ සංවර්ධනයක් කරා යන යුගයක සාම්ප්‍රදායික ලිපි ගොනු හා ලිපි සැකසීමේ ක්‍රමය වෙනුවට විද්යුත් ලේඛන කළමනාකරණ ක්‍රමයක්ද හඳුන්වා දුනිමු. ඒ යටතේ ලිපියක කෙටුම්පතක් මුද්‍රණය නොකර අදාල නිලධාරියා මෘදුකාංග පිටපතක් ලෙස ඉදිරිපත් කිරීමටත් සියළු ලිපිගොනු සටහන්පත්‍ර හා ලිපි මේ මගින් ඉදිරිපත්කර අත්සනද විද්යුත් ක්‍රමය මගින් ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇත. ඒ සඳහා අවශ්‍ය සියළු උපකරණ දැනට මිලට ගනිමින් පවතින අතර 2014 වර්ෂය තුල මුළුමනින්ම කඩදාසි භාවිතයෙන් තොර කාර්යාල කළමනාකරණ ක්‍රමවේදයෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

විජය වික්‍රමරත්න
සභාපති

## පටුන

පිටු අංකය


01. ආයතනික පසුබිම හා විෂය පථය 01 - 03

02. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන ව්‍යුහය 04 - 05

03. සභාව සහ රැස්වීම් 06

04. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන සටහන 07

05. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2013 වර්ෂයේදී සේවය කරන ලද සේවක ලැයිස්තුව හා ඔවුන්ගේ තනතුරු 08-10

කාර්ය මණ්ඩල සඳහා ධාරිතා වර්ධන වැඩසටහන් 10 - 11

06. වැඩසටහන් හා ව්‍යාපෘති

6.1 කිළිනොච්චි ව්‍යාපෘතිය 12 - 14

6.2 උපාධිධාරින්ගේ රැකියා තෘප්තිය පිළිබඳ සමීක්ෂණය 15 – 20

6.3 පාසැල් හැරයන සිසුන් සවිබල ගැන්වීමේ සමාජ සත්කාරක වැඩසටහන 21 – 25

6.4 දැයට කිරුළ වැඩසටහන 26 – 27

6.5 වෘත්තීය මාර්ගෝපදේශන පද්ධතියක් සකස් කිරීම 28

6.6 විද්‍යුත් ලේඛන ක්‍රමයක් හා දත්ත පද්ධතියක් හඳුන්වාදීම 28

6.7 වෙබ් අඩවිය සකස් ස්ථාපනය කිරීම 29

6.8 පුවත් හසුන පළ කිරීම 29

07. 2013 වසරේ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 30 - 31

08. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - ආදායම් සහ වියදම් ගිණුම 32

09. ශුද්ධ වත්කම්/සම කොටස් වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය 33

10. මුදල් ප්‍රවාහ ප්‍රකාශය 34 – 35

11. මූල්‍ය ප්‍රවාහ සඳහා සටහන් 35 – 42

12. ගිණුම්කරණ ප්‍රතිපත්තීන් 43 - 46

13. විගණන වාර්තාව හා පිළිතුරු 47-57

# වාර්ෂික වාර්තාව - 2013

## 1. ආයතනික පසුබිම හා විෂය පථය

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ වැදගත් කාර්ය භාරයක් ඉටුකිරීමට 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතින් ස්ථාපිත කරන ලද ආයතනයකි. එම ආයතනයට ලබාදී ඇති බලතල යටතේ මානව සම්පත් සංවර්ධනය සම්බන්ධව සියළු කටයුතු වලදී ප්‍රමුඛතාවය දීමටත් මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් ප්‍රතිපත්ති උපනයනය කිරීමටත් ප්‍රවර්ධනය කිරීමටත් ක්‍රියාත්මක කිරීමට සහාය ලබා දීමත් යනාදී වැදගත් කාර්යභාරයනට වගකීම දරයි. එහි මූලික අරමුණ වනුයේ අදාල අමාත්‍යවරයාටත්, රජයටත් මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් නිර්දේශ ලබා දෙන උසස් මට්ටමේ ආයතනයක් ලෙස සංවිධානය වීමයි.

### 1.1 ආයතනික හැඳින්වීම

ජාතික මට්ටමේ උපදේශක මණ්ඩලයක් වශයෙන් 1987 ජුනි මස 05 වන දින මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව ආරම්භ වූයේ යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ඒකකයක් වශයෙනි. ඉන් ඉක්බිතිව 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනත මඟින් ස්වාධීන ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදී. එතැන් සිට කෙටි කාලයක් තුලදී, එනම් 2000 වර්ෂයේදී මෙම ආයතනය කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතට පැවරෙන අතර, 2001 දී මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතට පවරනු ලැබීය. ඉන් පසු නැවත රජය වෙනස් වීමෙන් පසුව මෙම ආයතනය නිපුණතා සංවර්ධන, වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශයේ පාලනයට නතු කරනු ලැබීය. මෙසේ කෙටි කාලයක් තුල අමාත්‍යාංශ රැසකට අනුබද්ධවී කටයුතු කල මෙම ආයතනය වර්තමානයේදී යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ සිය කටයුතු පවත්වා ගෙන යනු ලබයි.

### 1.2 දර්ශනය

"දූරදක්නා නුවණින් හා නිපුණතාවයෙන් පිරිපුන් මානව සම්පතකින් හෙබි ජාතියක්"

### 1.3 මෙහෙවර

මානව සම්පත උදෙසා ඵලදායි ප්‍රතිපත්ති හා උපායමාර්ග සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීම හා පහසුකම් සැපයීම තුළින් **ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්ය** බවට පත්කිරීමට දායකවීම.

## 1.4 අරමුණ

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ අරමුණ වනුයේ රජයට මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් උපදෙස් සහ මාර්ගෝපදේශකත්වය දීමට සුදුසු ආයතනික රාමුවක් බිහිකිරීමයි. මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාවලි සැලසුම, ප්‍රතිපත්ති සමාලෝචනය හා මානව සම්පත් අංශ වර්ධනය කිරීමත් යනාදී අංශ සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව වගකීම් දරයි. සභා පනතට අනුව සභාවේ කාර්ය සහ කර්තව්‍ය පහත සඳහන් පරිදි වේ.

1. (අ) රැකිරක්ෂා, පුහුණුව හා අධ්‍යාපනය

   (ආ) විද්‍යාව හා තාක්ෂණය උපයෝගී කර ගැනීම

   (ඇ) ජීවන තත්වය නංවාලීම

   (ඈ) අවාසිකර තැනැත්තන්ගේ කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂාව සැලසුම් කිරීම සහ

   (ඉ) ආර්ථික ප්‍රතිසංස්කරණ මගින් හිමිකම් රැකදීම සම්බන්ධයෙන් වන හෝ අදාළ වන මානව සම්පත් බණ්ඩ පරිමේය කිරීම සහ සමෝධානය කිරීම ඇතුළුව, ජාතික මානව සම්පත් ප්‍රතිපත්තියේ සියලු අංශ වලින් අමාත්‍යවරයාට උපදෙස් දීම
2. ජාතික ප්‍රතිපත්තියට අනුකූල වූ මානව සම්පත් සංවර්ධනය කිරීමේ සැලසුම් හා වැඩසටහන් රජයට ඉදිරිපත් කිරීම සඳහා විෂයභාර අමාත්‍යවරයාට නිර්දේශ කිරීම.
3. ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය සහ ක්‍රියාත්මකව පවත්නා සැලසුම් සහ වැඩසටහන් කලින් කල සමාලෝචනය කිරීම හා පරීක්ෂා කර බැලීම සහ අවශ්‍ය වන විටක, ඒ ප්‍රතිපත්තියට සැලසුම්වලට හා වැඩසටහන්වලට කළයුතු වෙනස් කිරීම් අමාත්‍යවරයාට නිර්දේශ කිරීම.
4. ආණ්ඩුව විසින් අනුමත කරන ලද මානව සම්පත් සංවර්ධන සැලසුම් සහ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ගැන සොයා බැලීම
5. මේ පනතේ උපලේඛනයේ සඳහන් කවර හෝ විෂයයන් හා සම්බන්ධ යම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම. එසේ වුවද එම ව්‍යාපෘතිය වෙනත් යම් අමාත්‍යවරයෙකුට පවරා තිබෙන විෂයයන් හා සම්බන්ධ වන අවස්ථාවක, එය ක්‍රියාත්මක කිරීම, ඒ වෙනත් අමාත්‍යාවරයාගේ එකඟත්වය ඇතිව විය යුතුය සහ
6. ජාතික අරමුණුවලට අනුකූලව මානව සම්පත් සංවර්ධනය කිරීමට අවශ්‍ය යයි හෝ හිතකර යයි හෝ ආනුෂංගික යයි සභාව අදහස් කරන වෙනත් සියළු ක්‍රියා සිදු කිරීම

## 1.5 සභාව සතු බලතල

1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතේ 16 (2) (1) වන උප වගන්තිය අනුව සභාව සතු බලතල මෙසේය.

(අ) සභාවේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍යවන සමීක්ෂණ, විමර්ශන, අධ්‍යයන සහ පර්යේෂණ කිරීමට.

(ආ) මානව සම්පත් සංවර්ධනයට අදාලව කරුණු සම්බන්ධයෙන් විශේෂඥයන්ගේ, වෘත්තිකයන්ගේ හෝ මහජනයාගේ මතය දැන ගැනීම සඳහා ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව කරුණු විමසීමට.

(ඇ) සභාව විසින් ඉටුකරනු ලබන කර්තව්‍ය වලට සමාන කර්තව්‍ය ඉටු කරන ශ්‍රී ලංකාවෙන් බැහැර පිහිටි ජාත්‍යන්තර නියෝජ්‍යායතන සහ වෙනත් සංවිධාන සමඟ සම්බන්ධතා ඇතිකර පවත්වාගෙන යාමට.

(ඈ) මේ පනත යටතේ සභාවේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සියළු කොන්ත්‍රාත්තුවලට සහ ගිවිසුම්වලට එළඹීමට සහ ඒවා ඉටු කිරීමට.

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ විදේශීය රටවල පිහිටි ආයතන හෝ පුද්ගලයින් මගින් මානව සම්පත් සංවර්ධන පර්යේෂණ පැවැත්වීම සඳහා කටයුතු වල යෙදීමට.

(ඊ) මානව සම්පත් සංවර්ධනය හා ඊට සම්බන්ධ ක්ෂේත්‍ර පිළිබඳව තොරතුරු දත්ත බැංකුවක් පිහිටුවා පවත්වාගෙන යාමට.

(උ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරිකිරීම් හෝ තැන්පතු ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට.

(ඌ) චංචල සහ නිශ්චල යන දෙවර්ගයේම ආධාර හා පරිත්‍යාග පිළිගැනීමට සහ භාරගැනීමට.

(එ) මානව සම්පත් සංවර්ධනයේ විවිධ අංශවල නිපුණ විශේෂඥ සංචිතයක් සංවර්ධනය අරමුණු කර ගෙන සභාවේ නිළධරයන්ගේ දක්ෂතා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට.

(ඒ) සභාවේ කර්තව්‍ය සාර්ථක ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය වන කමිටු විශේෂඥ කණ්ඩායම් සහ උපදේශක මණ්ඩල පත් කිරීමට.

(ඔ) අමාත්‍යාංශවලින්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු වලින්, රාජ්‍ය සංස්ථාවලින්, ව්‍යවස්ථාපිත මණ්ඩලවලින්, පළාත් සභා වලින්, පළාත් පාලන ආයතනවලින් සහ පෞද්ගලික අංශයේ ආයතනවලින් ලබා ගන්නා සංඛ්‍යා ලේඛන ඇතුළුව සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන තොරතුරු ඉල්ලා සිටීමට සහ ඒවා ලබා ගැනීමට.

(ඕ) සභාවේ කර්තව්‍ය බලතල සහ කාර්ය ඉටු කිරීම ක්‍රියාත්මක කිරීම සහ සිදු කිරීම සඳහා අවශ්‍ය යැයි හිතකර යැයි හෝ ආනුෂංගිකයයි සභාවේ මතය අනුව සභාව විසින් සලකනු ලබන සියළු පියවර ගැනීමට.

## 02. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන ව්‍යුහය

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම සභාව 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතේ දැක්වෙන විධි විධාන අනුව පත් කරනු ලබන සභාපතිවරයෙකුගේ හා සාමාජිකයන් 20 දෙනෙකුගෙන් සමන්විත වේ. ඉන් 15 දෙනෙකු නිල බලයෙන් හා අදාල ආයතන වලින් 5 දෙනෙකු වශයෙනි. ඒ හැරුණු විට අදාල ක්ෂේත්‍රයන්හි පලපුරුද්ද හැකියාව යනාදිය සලකා 5 දෙනෙකු පත්කරනු ලබන අතර මින් දෙදෙනෙකු පුද්ගලික අංශයෙන් වේ. සභා සභිකයන් අතුරෙන් එක් අයෙකු විධායක සභාපති සේ නම් කිරීමට විෂයභාර ඇමතිතුමාට බලය පැවරේ. මෙහි ප්‍රධාන විධායක නිළධාරියා වනුයේ සභාවේ සභාපතිය. 2013.12.31 දින වනවිට සාමාජිකයන් 19 දෙනෙකුගෙන් සමන්විත විය.

2013 වර්ෂයේ සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය.

**පනතේ 3(1) (අ) සිට (ව) දක්වා වගන්ති යටතේ කර ඇති පත්වීම්**

| | | | |
|---|---|---|---|
| 1. | විජය වික්‍රමරත්න මහතා | - | සභාපති, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව |
| 2. | කේ.ඒ. තිලකරත්න මහතා | - | ලේකම්, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය |
| 3. | ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා | - | ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය |
| 4. | අනුර දිසානායක මහතා | - | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය |
| 5. | වෛද්‍ය වයි.ඩී. නිහාල් ජයතිලක මහතා | - | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 6. | ධාරා විජේතිලක මහත්මිය | - | ලේකම්, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය |
| 7. | ඩබ්.ජේ.එල්.යූ. ජයවීර මහතා | - | ලේකම්, කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය |
| 8. | පී.බී. අබේකෝන් මහතා | - | ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
| 9. | අනුර සිරිවර්ධන මහතා | - | ලේකම්, කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශය |
| 10. | ආර්.එම්.ඩී.බී. මීගස්මුල්ල මහතා | - | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 11. | මහාචාර්ය දයන්ත එස්. විජේසේකර මහතා | - | සභාපති, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව |

| | | | |
|---|---|---|---|
| 12. | ආචාර්ය රසික පෙරේරා මහතා | - | අධ්‍යක්ෂ ජනරාල්, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව |
| 13. | මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක මහතා | - | සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව |
| 14. | මහාචාර්ය ක්ෂනිකා හිරිඹුරේගම මිය | - | සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |
| 15. | චන්දන අරුණදේව මහතා | - | සභාපති, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය |
| 16. | ඒ. දයාරත්න මහතා | - | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව |

**පනතේ 3(2) (ජ) වගන්තිය යටතේ කර ඇති පත්වීම**


| | | | |
|---|---|---|---|
| 1. | පියදාස පතිරණ වීරසිංහ මහතා | - | සරසි, රදම්පොල, ඌරුගමුව |
| 2. | ලලිතා විතානාච්චි මිය | - | අංක. 377, තංගල්ල පාර, මැද්දවත්ත, මාතර |
| 3. | ආර්. වික්‍රමසිංහ මයා | - | 36 C , විහාර මාවත, පැපිලියාන |

**3.සභාව සහ රැස්වීම**

**2013 වර්ෂයේ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ පාලක මණ්ඩල රැස්වීම් පැවැත්වූ දිනයන් හා සහභාගී වූ සාමාජිකයන් පිලිබඳ විස්තර**

| | පාලක මණ්ඩල සාමාජිකයාගේ නම | 2013.01.18 | 2013.03.27 | 2013.05.23 | 2013.08.02 | 2013.10.31 | 2013.12.27 |
|---|---|---|---|---|---|---|---|
| 01. | සභාපති,<br>මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව | √ | √ | √ | √ | √ | √ |
| 02. | ලේකම්,<br>යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | √ | - | - | - | - | - |
| 03. | ලේකම්,<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | - | - | - | √ | - | - |
| 04. | ලේකම්,<br>අධ්‍යාපන අමාත්‍යාංශය | - | - | - | - | - | - |
| 05. | ලේකම්, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | √ | - | - | - | - | - |
| 06. | ලේකම්,කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | - | - | - | - | √ | - |
| 07. | ලේකම්,රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | - | - | - | - | - | - |
| 08. | ලේකම්,<br>සෞඛ්‍ය අමාත්‍යාංශය | - | - | - | - | - | - |
| 09. | ලේකම්,කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | - | - | - | - | - | √ |
| 10. | ලේකම්,<br>කෘෂිකර්ම අමාත්‍යාංශය | √ | √ | - | - | √ | √ |
| 11. | සභාපති,<br>තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | √ | √ | - | √ | √ | √ |
| 12. | අධ්‍යක්ෂ ජනරාල්,<br>තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | √ | - | √ | √ | - | √ |
| 13. | සභාපති,<br>ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | √ | - | √ | √ | √ | √ |
| 14. | සභාපති,<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | - | √ | - | √ | √ | √ |
| 15. | සභාපති,<br>ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | - | - | - | - | - | - |
| 16. | ලේකම්,<br>මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය (නියෝජිත) | √ | √ | √ | √ | √ | √ |
| 17. | පත්කල සාමාජික - ලලිතා විතානච්චි මිය | - | - | √ | - | √ | √ |
| 18. | පත්කල සාමාජික - පියදාස පී. වීරසිංහ මහතා | √ | √ | | √ | √ | √ |
| 19· | පත්කල සාමාජික - ආර්. වික්‍රමසිංහ මහතා | - | √ | √ | √ | √ | √ |
| | | 09 | 07 | 06 | 09 | 10 | 11 |

**4.  මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා  ජාතික සභාව - සංවිධාන ව්‍යුහය**



**5.** මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සේවය කරන ලද සේවක ලැයිස්තුව හා ඔවුන්ගේ තනතුරු

| තනතුරු නාමය | අනුමත සේවක සංඛ්‍යාව | **2013.12.31** දිනට සේවයේ යෙදී සිටින සංඛ්‍යාව | **2013.12.31** දිනට පුරප්පාඩු සංඛ්‍යාව | නම |
|---|---|---|---|---|
| සභාපති | 01 | 01 | - | විජය වික්‍රමරත්න මහතා |
| අධ්‍යක්ෂ | 01 | 01 | - | තුලිත වික්‍රම මහතා |
| සහකාර අධ්‍යක්ෂ | 03 | 03 | - | එස්. තනගසීලන් මහතා<br>යූ.එස්.ටී. විතානගේ මහතා<br>ජේ.ඒ.සී.පී. ජයසිංහ මිය |
| සභා ලේකම්/නීති නිලධාරි | 01 | 01 | - | ජී.ජී. කසුනි උත්පලා මෙනවිය |
| පර්යේෂණ නිලධාරි | 04 | 04 | - | ආර්.එම්.ඒ. යූ.කේ. රත්නායක මිය<br>ඒ.එච්.ඩී.සී. පෙරේරා මෙනවිය<br>එච්.ඩී.ඒ.ඒ. හතුරුසිංහ මෙනවිය<br>ඩී.එම්.එස්.එන්.බී. ජයතිලක මහතා |
| පරිපාලන නිලධාරි | 01 | 01(කා.පැ) | - | චාමිනි කාරියවසම් මිය |
| භාෂා පරිවර්තක | 01 | - | 01 | - |
| සංවර්ධන නිලධාරි | 04 | 03 | 01 | පී.ඊ.එස්. සේනාරත්න ද සිල්වා මිය<br>ආර්.ඩී.සී.එස්. රාජපක්ෂ මහතා<br>කේ.පී.පී. පෙරේරා මහතා |
| සභාපතිගේ පෞද්ගලික සහකාර | 01 | 01(වැ.බ.) | - | නාලිකා රත්නායක මෙනවිය |
| කළමනාකරණ සහකාර | 08 | 07 | 01 | කේ.එස්.එන්. පෙරේරා මිය<br>සී.කේ. ජයසේකර මිය<br>සී.ආර්. මද්දගේ මහතා<br>කේ.ඒ.එම්. දමයන්ති මිය<br>එම්.ජී.එන්. දිල්හාරි මෙනවිය<br>ඩබ්.එම්. ලක්ෂිත රජිත් මහතා<br>පී.එච්.ජී.සී. ප්‍රියදර්ශණී මෙනවිය |
| රියැදුරු | 04 | 03 | 01 | ජී.එම්. පින්නදූව මහතා<br>ඩබ්.එච්.ඊ. ජයරත්න මහතා<br>එන්.ජී.ඉශාන් රෙක්ස්මන්ඩ් මහතා |
| කාර්යාල සහායක | 04 | 04 | - | බුද්ධික විජේසිංහ මහතා<br>එන්.ජී. නදුන් මධුරංග මහතා<br>ඩබ්.ආර්.ඒ. ප්‍රින්ස් ග්‍රැන්විල් මහතා<br>ඒ. නයනා ප්‍රියදර්ශණී මෙනවිය |
| **මුළු එකතුව** | **33** | **29** | **04** | |

2012 වර්ෂයේ අග භාගයේදී ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30හි විධිවිධාන අනුව සංශෝධිත බඳවාගැනීමේ පරිපාටිය 2013/03/05 දින අනුමත කරවා ගත හැකි විය. ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය තුල මෙතෙක් පුරප්පාඩු වී තිබූ මාණ්ඩලික තනතුරු ඇතුලු සියලු තනතුරු සඳහා සුදුසුකම් ලත් නිලධාරීන් බඳවා ගැනීම මෙම වර්ෂය තුලදී සිදු කරන ලදී. ඒ අනුව සභා පනතින් පැවරී ඇති කාර්යභාරයන් ක්‍රියාකාරී සැලැස්මට අදාලව ඉටු කිරීමට 2013 වර්ෂය අග භාගයේ සිට හැකියාව ලැබුණි.

**නව බඳවා ගැනීම්**

| නම | තනතුර | බඳවාගත් දිනය |
|---|---|---|
| ජී.ජී. කසුනි උත්පලා මෙනවිය | සභා ලේකම්/නීති නිලධාරි | 2013.05.02 |
| තුලිත වික්‍රම මහතා | අධ්‍යක්ෂ | 2013.06.03 |
| එස්. තනගසීලන් මහතා | සහකාර අධ්‍යක්ෂ(පර්යේෂණ) | 2013.06.03 |
| ජේ.ඒ.සී.පී. ජයසිංහ මිය | සහකාර අධ්‍යක්ෂ(සංවර්ධන) | 2013.06.03 |
| ආර්.එම්.ඒ. යූ.කේ. රත්නායක මිය | පර්යේෂණ නිලධාරි | 2013.06.03 |
| ඒ.එච්.ඩී.සී. පෙරේරා මෙනවිය | පර්යේෂණ නිලධාරි | 2013.06.03 |
| යූ.ජී.ටී.සී. ආරියරත්න මහතා | සංවර්ධන නිලධාරි | 2013.06.03 |
| පී.ඊ.එස්. සේනාරත්න ද සිල්වා මිය | සංවර්ධන නිලධාරි | 2013.06.03 |
| කේ.පී.පී. පෙරේරා මහතා | සංවර්ධන නිලධාරි | 2013.06.03 |
| ආර්.ඩී.සී.එස්. රාජපක්ෂ මහතා | සංවර්ධන නිලධාරි | 2013.06.03 |
| එම්.ජී.එන්. දිල්හාරි මෙනවිය | කළමනාකරණ සහකාර | 2013.06.03 |
| ඩබ්.එම්. ලක්ෂිත රජිත් මහතා | කළමනාකරණ සහකාර | 2013.06.03 |
| පී.එච්.ජී.සී. ප්‍රියදර්ශනි මෙනවිය | කළමනාකරණ සහකාර | 2013.06.03 |
| එන්.ජී.ඉශාන් රෙක්ස්මන්ඩ් මහතා | රියැදුරු | 2013.06.03 |
| එන්.ජී. නදුන් මධුරංග මහතා | කාර්යාල සහායක | 2013.06.03 |
| ඩබ්.ආර්.ඒ. ප්‍රින්ස් ග්‍රැන්විල් මහතා | කාර්යාල සහායක | 2013.06.03 |
| ඒ. නයනා ප්‍රියදර්ශණී මෙනවිය | කාර්යාල සහායක | 2013.06.03 |
| යූ.එස්.ටී. විතානගේ මහතා | සහකාර අධ්‍යක්ෂ(මූල්‍ය) | 2013.06.16 |
| එච්.ඩී.ඒ.ඒ. හතුරුසිංහ මෙනවිය | පර්යේෂණ නිලධාරි | 2013.11.01 |
| ඩී.එම්.එස්.එන්.බී. ජයතිලක මහතා | පර්යේෂණ නිලධාරි | 2013.11.20 |

**අනුයුක්ත කිරීම**

| නම | තනතුර | අනුයුක්ත ආයතනය | අනුයුක්ත කල දිනය |
|---|---|---|---|
| ජී.එම්. පින්නදූව මහතා | රියදුරු | ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය | 2013.07.15 |

**රාජකාරී පැවරීම**

| නම | තනතුර | රාජකාරී පැවරූ දිනය |
|---|---|---|
| චාමිනි කාරියවසම් මිය | පරිපාලන නිලධාරි | 2013.07.01 |

**සේවයෙන් ඉල්ලා අස්වීම්**

| නම | තනතුර | ඉල්ලා අස්වූ දිනය |
|---|---|---|
| එම්.කේ.පී. ලක්මාල් මහතා | රියදුරු | 2013.10.31 |
| යූ.ජී.ටී.සී. ආරියරත්න මහතා | සංවර්ධන නිලධාරි | 2013.11.14 |
| තුලිත වික්‍රම මහතා | අධ්‍යක්ෂ | 2013.12.31 |

**කාර්ය මණ්ඩල සඳහා ධාරිතා වර්ධන වැඩසටහන්**

රාජ්‍ය සේවයට නවකයන්වූ මේ සියළු දෙනාගේම ධාරිතා වර්ධන අවශ්‍යතා හඳුනාගෙන මානව සම්පත් සංවර්ධනයට අදාල විවිධ විෂයයන් ඔස්සේ පුහුණු වැඩමුළු සංවිධානය කළ අතර එම වැඩමුළු සඳහා යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ හා එම අමාත්‍යාංශය යටතට ගැනෙන අනිකුත් ආයතන 16 හි කාර්ය මණ්ඩල සඳහාද සහභාගී වීමට අවස්ථාව ලබා දුනිමු. ඒ යටතේ පවත්වන ලද පුහුණු වැඩ සටහන් හා ඒ සඳහා සහභාගීවූ සංඛ්‍යාව (1) වගුවේ දැක්වෙන අතර මානව සම්පත් සංවර්ධන සභාවේ කාර්ය මණ්ඩලය සඳහා පමණක් පවත්වන ලද වැඩසටහන් (2) වගුවෙන් දැක්වේ.

විශේෂයෙන්ම සමීක්ෂණ අධ්‍යයන හා පර්යේෂණ පැවැත්වීමටත් සංවර්ධන ව්‍යාපෘතීන් සැළසුම් කිරීමටත් එමෙන්ම ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි වලටත් අදාල මෙම පුහුණුව තුළින් අපගේ කාර්ය මණ්ඩලය ඉතා කෙටිකලකින්ම පරිණත බුද්ධියෙන් හෙබි කාර්ය මණ්ඩලයක් බවට පත්විය.

1වගුව

| ආයතනයේ නම | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | ව්‍යාපෘති වාර්තා සැකසීම | | | විගණනයෙන් තොර රාජ්‍ය සේවයක් | අභිමානවත් රාජ්‍ය සේවයක් | මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ගුණාත්මක පර්යේෂණ ක්‍රම [illegible] | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2013.01.21 | 2013.01.28 | 2013.01.29 | 2013.02.19 | 2013.02.28 | 2013.4.30 | 2013.6.14 | 2013.6.17 |
| මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව | 12 | 8 | 8 | 8 | 12 | 6 | 10 | 13 |
| යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | 29 | 2 | - | - | 1 | 18 | 5 | 2 |
| ග්‍රාමීය නායකයන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානය | 5 | 6 | 6 | 4 | - | 1 | 12 | 12 |
| තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂම | 12 | 12 | 10 | 8 | - | 4 | 6 | 4 |
| යොවුන් සේනාංකය | - | 5 | 5 | 4 | - | - | - | - |
| සීස.ජාතික තරුණසේවා සමූපකාර සංගමය | 5 | 2 | 2 | 2 | - | | 2 | 2 |
| සීස. තරුණසේවා සමාගම | 3 | - | - | - | - | - | - | - |
| සාගර විශ්වවිද්‍යාලය | 9 | 4 | 4 | 4 | - | 1 | 3 | 3 |
| වෘත්තීය පුහුණු අධිකාරිය | 20 | 7 | 7 | 5 | 15 | 22 | 3 | 3 |
| කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුව | 16 | 4 | 4 | 4 | 6 | - | - | - |
| ජාතික තරුණසේවා සභාව | - | 6 | 6 | 6 | 5 | 16 | 4 | 3 |
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය | - | 4 | 4 | 4 | 10 | 10 | 2 | 2 |
| ජර්මන් කාර්මික අභ්‍යාස විද්‍යාලය | 3 | 3 | 5 | - | 5 | 7 | - | - |
| | **114** | **63** | **61** | **49** | **54** | **85** | **47** | **44** |

2වගුව

| මූල්‍ය රෙගුලාසි සහ ආයතන සංග්‍රහය | කාර්යාල කළමනාකරණය | ප්‍රසම්පාදනය (1) | අභිමානවත් රාජ්‍ය සේවයක් | නිවාඩු පිළිබඳ වැඩමුළුව | මෙහෙයවීම හා ඇගයීම පිළිබඳ වැඩමුළුව | | ප්‍රසම්පාදනය (2) | සන්නිවේදනය | ව්‍යාපෘති වාර්තා සැකසීම | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2013.06.24 | 2013.07.17 | 2013.08.02 | 2013.08.16 | 2013.09.09 | 2013.09.17 | 2013.09.18 | 2013.09.21 | 2013.10.15 | 2013.10.28 | 2013.10.29 | 2013.11.28 |
| 17 | 11 | 18 | 16 | 22 | 15 | 14 | 16 | 18 | 13 | 10 | 11 |
| **17** | **11** | **18** | **16** | **22** | **15** | **14** | **16** | **18** | **13** | **10** | **11** |

## 6.වැඩසටහන් හා ව්‍යාපෘති

### 6.1 කිලිනොච්චි ව්‍යාපෘතිය 2013

මෙම ව්‍යාපෘතියෙහි මූලික අරමුණ වන්නේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ අවතැන් වූ පවුල් 7000ක් පමණ සංඛ්‍යාවක් පිළිබඳ මෙම සුවිශේෂී අධ්‍යයනයේ දී හෙළිදරව් කර ඇත.

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ අර්බුදයෙන් පීඩාවට පත් ප්‍රදේශවල අවතැන්වූ ප්‍රජාව පිළිබඳ අධ්‍යයනයෙහි අරමුණ වූයේ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව විසින් ප්‍රතිපත්ති නිර්දේශ කිරීමයි. කිලිනොච්චියෙහි මූලික අධ්‍යයන අදියර ( 2013 ජූලි - 2013 දෙසැම්බර්) මඟින් අවධානය යොමු කරන ලද්දේ බොහොමයක් ක්ෂේත්‍ර (යටිතල පහසුකම්, අධ්‍යාපනය සහ පුහුණුකිරීම්, කෘෂිකර්මාන්තය, සෞඛ්‍යය, ස්වයං රැකියා ආදිය) ඒකාබද්ධ කරමින් ඉක්මණින් ඉටුකළ යුතු අවශ්‍යතාවන් සහ විසඳුම් හඳුනා ගැනීමයි.

මූලික කරුණු , අවශ්‍ය බව පෙනීයන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සහ අනාගතයේදී එවැනි සමාජ ව්‍යසනයන් සිදුවීම වළකා ගැනීම සඳහා අවශ්‍ය වලක්වා ගැනීමේ ක්‍රියාමාර්ග පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම පිණිස මෙම අධ්‍යනය ඉවහල් විය.

**අධ්‍යයනයේ නියැදි ජනගහනය**

අනර්ථයට ලක්වූ පවුල් වලින් තෝරාගත් නියැදි ජනගහනයන්

| ප්‍රශ්නාවලිය | පූනකරි | පච්චිලෛපලෛ | කන්දාවලී | කරච්චි | එකතුව |
|---|---|---|---|---|---|
| කුඩා | 771 | 504 | 1352 | 3406 | 6033 |
| විශාල | 182 | 184 | 83 | 222 | 671 |
| එකතුව | 953 | 688 | 1435 | 3628 | 6704 |

පහත පරිදි සහභාගිවන්නන් අතර ප්‍රශ්නාවලි බෙදාහරින ලදී :

අ ) කිලිනොච්චිවල සිටින අවතැන්වූ පුද්ගලයින්

ආ) කන්දාවලි වලින් 1435

ඇ) පච්චිලෛපලෛ වලින් 688 සහ

ඈ) වැඩි වශයෙන් පීඩාවන්ට ලක්වන ප්‍රජාවන් අතරින් පූනකරි වෙතින් 953ක් තෝරා ගන්නා ලදී.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් වැන්දඹුවන් ස්ත්‍රීන්, වැන්දඹු පුරුෂයින් සහ දෙමව්පියන් අහිමි වූවන් සහිත අනර්ථයට වැඩි වශයෙන් ලක් වූ කණ්ඩායම් ලෙස හඳුනාගත් මුළු පවුල් සංඛ්‍යාව 6704කි.

අධ්‍යයනය සිදුකිරීමෙන් අනතුරුව පහත සඳහන් ප්‍රතිඵල ලැබුණි. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵලයක් ලෙස විෂාද ලක්ෂණ දැකිය හැකි පහත වගුවේ දක්වා ඇති වැදගත් තොරතුරු අනාවරණය කර ගත හැකිවිය.

| අනුක්‍රමික අංකය | ක්ෂේත්‍රය | ප්‍රතිශතය |
|---|---|---|
| 01 | මානසික අවපීඩනය | 95% (විෂාද ලක්ෂණ) |
| 02 | රැකියා විරහිත බව | 68% |
| 03 | රැකියා විරහිත භාවය නිසා ප්‍රධාන හේතුව | 30% (දිස්ත්‍රික්කයන්හි රැකියා හිඟබව) |
| 04 | වෘත්තීය පුහුණුව (වයස 15 සිට 29 දක්වා) | 65% ලැබී නැත |
| 05 | වඩාත් ප්‍රිය කරනු ලබන රැකියා මනාපය | 67 (ස්වයං රැකියා) 10 |
| 06 | ස්වයං රැකියා ලාභියෙකු වීම සඳහා අවස්ථාව | 37% (අවස්ථාවක් නොමැති) |

පර්යේෂණ වල සොයාගැනීම් වලට අනුව අප විසින් සම්මේලන දෙකක් සංවිධානය කළ අතර, ඒවා පිළිවෙලින් අදාළ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟින් 2013.10.21 දින කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ද අදාළ රේඛීය අමාත්‍යාංශ සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟින් 2013.12.04 වන දින ද පවත්වන්නට යෙදුණි. මෙම සම්මේලනයන්ගෙන් අපට අන් සියල්ලන්ගේ මතවාද, අදහස්, යෝජනා සහ නිර්දේශ ලබා ගත හැකිවිය.

ඉහත සාකච්ඡාවේදී පහත යෝජනා නිර්දේශ කෙරිණි.

1. සැලකිල්ලට භාජනය වී නොමැති ප්‍රජාවේ මෙම කොටසෙහි පීඩාවන් සඳහා සහනයන් ලබාදීම පිණිස මෙන්ම මේ ආකාරයෙන් ප්‍රජාවගේ විසඳුම් ලබා නොදුන් සමාජ සහ සංස්කෘතික අවශ්‍යතා ඉටු කරලීම පිණිස ශ්‍රී ලංකා රජයේ මැදිහත්වීම වැදගත් අවශ්‍යතාවක් ලෙස කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සොයා ගැනීම් හඳුනා ගැනීම
2. කාන්තා මූලිකත්වය සහිත නිවාස සඳහා ජීවිකා වෘත්තිය සලසා දීම
3. ඵලදායී ලෙස සේවයේ නියුතු වන අතර කුසලතා සංවර්ධන පුහුණු වැඩ සටහන් සපයා දීම (තරුණයින්ට/වැඩිහිටි කාන්තාවන්ට)
4. අධ්‍යාපන පුහුණු ආයතන සොයාගැනීම ( ජංගම /ස්ථාවර පදිංචි ස්ථානයට ආසන්න)

5. දැනුම සහ රැකියා මෙවලම් කට්ටල බෙදාහදා ගැනීම පිණිස ඉහත සඳහන් අවතැන්වූ ප්‍රජාව සඳහා CBOs නිර්මාණය කිරීම ( පොත්, මාර්ගෝපදේශක, උපදේශන, රැකවරණය සහ අවධානය අවශ්‍ය කරනු ලබන ළමුන් සහ ළදරුවන්)
6. අදාළ රාජ්‍ය නියෝජිතායතන සඳහා ඉහතකී වෛද්‍ය අනුග්‍රය සහ සහාය සඳහා ප්‍රජාවට ප්‍රවේශය සොයාගැනීම (මානසික සෞඛ්‍යය සහ අදාළ මැදිහත්වීම් ද මේ සඳහා ඇතුලත් වේ)
7. තරුණයින් සහ වැඩිහිටි කාන්තාවන් ලෙස ජීවන සහාය හිමිවිය යුතු පාර්ශ්වයන් ලෙස ළදරුවන් සහ ළමුන් අන්තර්ගත කිරීම
8. CBOs ඇතිකිරීම මඟින් අනර්ථයට ලක්වූ පාර්ශවයන්ගේ ස්වයං විශ්වාසය නැවත ඇතිකිරීම පිණිස ඔවුන් අතර දැනුවත්භාවය ඇතිකරලීම සඳහා ආර්ථික සංවර්ධන හා මුදල් අමාත්‍යංශය යටතේ ගැණිය හැකි සමාජ සවලීකරණය සක්‍රීයනය කිරීම (ක්ෂුද්‍ර ණය ප්‍රවේශය සඳහා) ( බැංකු අංශය මඟින් CBOs වෙත ප්‍රති ණය ලබාදීම් ප්‍රතිපත්තිවල දැඩි ස්ථාවරයන් ලිහිල් කිරීම)
9. අවශ්‍ය තන්හිදී වෘත්තීය පුහුණුව ලබාදීම පිණිස රජයේ මැදිහත්වීම සඳහා ශ්‍රී ලංකා රජයේ අන්තර් අමාත්‍යංශයන්ගෙන් සමන්විත යාන්ත්‍රයක් ඇතිකරලීම ඒ සම්බන්ධයෙන් ආයෝජනය කිරීම පිණිස රාජ්‍ය නොවන සංවිධාන, අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන, CBOs යොමුකරවා ගැනීම. එමෙන්ම මැදිහත්වීම තුළින් පදිංචිකරුවන්ගේ අපේක්ෂා ඉටුකරනු ඇත. මෙහිදී උපයන අතර ඉගෙනුම ලැබීම යන සංකල්පය (රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස සැලකෙන සැලකිල්ලට භාජනය නොවූ /අනර්ථයට ලක්වූ ප්‍රජාවගේ දෛනික ආදායමට බාධා නොකර රැකියා පුහුණුව) බොහෝ දෙනාගේ අගය කිරීමට ලක්ව ඇත.

## 6.2 උපාධිධාරීන් රාජ්‍ය අංශයට බඳවා ගැනීම, ඔවුන්ගේ රැකියා තෘප්තිය සහ රාජ්‍ය අංශයේ ඵලදායිතාවයට සිදු වූ බලපෑම පිළිබඳ සමීක්ෂණය

**<u>සමීක්ෂණ අරමුණ</u>**

**ප්‍රධාන අරමුණ**

උපාධිධාරීන්ගේ රැකියා තෘප්තිය, රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාවය සහ සඵලදායිතාවය වැඩිවන ආකෘතියේ සුදුසු බඳවා ගැනීම් ආකෘතියක් හඳුන්වා දීමට අවශ්‍ය දැනුම ලබාගෙන සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කිරීම.

**උප අරමුණු**

01 අභ්‍යාසලාභී උපාධිධාරී ක්‍රමයේ දුර්වලතා හා ශක්තීන් හඳුනා ගැනීම.

02 අභ්‍යාසලාභී උපාධිධාරීන්ගේ බඳවා ගැනීම යටතේ ඔවුන්ගේ රැකියා කැමැත්ත හා ස්ථානගතවීම අතර පවත්නා සබඳතාවය හඳුනා ගැනීම.

03 උපාධිධාරීන්ගේ රැකියා තෘප්තියට සහ රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාවය සහ සඵලදායිතාවය සඳහා බලපාන සාධක

**<u>පර්යේෂණ ක්‍රමවේදය</u>**

2005/2012 වර්ෂවලදී වැඩිම බඳවා ගැනීම් සිදුකරන ලද අමාත්‍යාංශ 06ක් තෝරා ගෙන ඉන් තෝරා ගන්නා ලද උපාධිධාරීන් 2000ක් සමීක්ෂණය කරන ලදී.

**<u>නියැදිය තෝරා ගැනීම</u>**

| අනු අංකය | අමාත්‍යාංශය | උපාධිධාරීන් | | තෝරා ගන්නා ලද නියැදිය | |
|---|---|---|---|---|---|
| | | **2005** | **2012** | **2005** | **2012** |
| 01 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 224 | 8999 | 41 | 1645 |
| 02 | ළමා සංවර්ධන හා කාන්තා සබඳතා අමාත්‍යාංශය | 406 | 474 | 85 | 87 |
| 03 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 0 | 60 | 0 | 12 |
| 04 | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය | 249 | 146 | 26 | 50 |
| 05 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 22 | 103 | 4 | 12 |
| 06 | සමාජ සේවා අමාත්‍යාංශය | 150 | 99 | 26 | 12 |
| **එකතුව** | | **10093** | | **2000** | |

## <u>දත්ත සහ ක්‍රම</u>

දත්ත :-

ප්‍රාථමික දත්ත සහ ද්විතික දත්ත යන්න යොදා ගන්නා ලදී. එහිදී ද්විතීක දත්ත සඳහා අන්තර්ජාලය, ජන සහ සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් දත්ත ලබා ගත හැකි දත්ත වාර්තා යොදා ගන්නා ලදී. ප්‍රාථමික දත්ත එකතු කිරීම සඳහා තැපැල් මාර්ගික ව්‍යුහගත ප්‍රශ්නාවලියක් සහ අමාත්‍යාංශවල උපාධිධාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. එමෙන්ම අමාත්‍යාංශවල ප්‍රධානීන් සඳහා ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී.

මෙම ලබා ගන්නා ලද දත්ත ගුණාත්මක දත්ත මෙන් ප්‍රමාණාත්මක දත්ත වශයෙන් ලබා ගන්නා ලදී.

**ක්‍රම :-**

මෙම එකතු කර ගන්නා ලද දත්ත විශ්ලේෂණය කිරීම සඳහා Ms excel, Spss දත්ත විශ්ලේෂණය ක්‍රමයන් යොදා ගන්නා ලදී.

## <u>ගැටළුව විග්‍රහ කිරීම</u>

මෙතෙක් රාජ්‍ය අංශයට බඳවා ගන්නා ලද උපාධිධාරීන්ගේ පසුබිම පිළිබඳ පවත්නා දත්ත වාර්තා අනුව සළකා බලද්දී රාජ්‍ය අංශයට උපාධිධාරීන් බඳවා ගැනීම පිළිබඳ සුදුසු ප්‍රතිපත්තියක් නොමැතිවීම අඩුවක් ලෙස දැක්වීමට පුළුවන. එහිදී එම පවත්නා තත්වය පිළිබඳ සොයා බලා සුදුසු ප්‍රතිපත්තියක් ගොඩ නැගීමට අවශ්‍ය නිර්දේශයන් ඉදිරිපත් වී නොතිබීම අඩුපාඩුවක් වේ.

එබැවින් රාජ්‍ය අංශයට උපාධිධාරීන් බඳවා ගැනීමේදී එම බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටියේ බොහෝ දූර්වලතාවයන් මෙන්ම ශක්තීන්ද දක්නට ලැබේ. බොහෝ විට එකවර විශාල සංඛ්‍යාවකට රාජ්‍ය අංශයේ රැකියා හිමිවීම එක්තරා සුභවාදී තත්වයකි. එහෙත් මෙම බඳවා ගැනීමේ පටිපාටිය තුළ උපාධිධාරීන්ගේ කැමැත්ත සහ ගැළපීම යන්න මත උපාධිධාරීන් සේවා නියුක්ත වීම සිදු නොවීම දූර්වලතාවයකි. මෙවැනි වූ තත්වයක් පිළිබඳව සොයා බැලීම මෙම සමීක්ෂණයේ ප්‍රධාන අරමුණ වේ.

## <u>උපාධිධාරී සමීක්ෂණය යටතේ පවත්වන ලද වැඩමුළු</u>

01) දිනය : 2013/10/23

ස්ථානය : හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිජන පර්යේෂණ සහ පුහුණු ආයතනය

සහභාගිවූවන් : උපාධිධාරීන් (34)

අරමුණ : අපගේ සමීක්ෂණයේ ප්‍රතිඵල මත පදනම්ව ඔවුන්ගේ යෝජනා සහ අදහස් ලබා ගැනීම.

ප්‍රතිඵල : 01. අප ප්‍රතිඵල වලට අනුව ඒවා තවදුරටත් තහවුරු තළ හැකි තොරතුරු ලබා ගැනීමට හැකිවීම.

02. ලබා ගැනීමට නොහැකි වූ ගුණාත්මක දත්ත එකතු කර ගැනීමට හැකිවීම.

03. තව දුරටත් ඔවුන්ගේ අදහස්, යෝජනා, අත්දැකීම් ලබා ගැනීමට හැකිවීම.

02) දිනය : 2013/10/24

ස්ථානය : හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිජන පර්යේෂණ සහ පුහුණු ආයතනය

සහභාගිවූවන් : අමාත්‍යාංශ අතිරේක ලේකම්වරු සහ ආයතන ප්‍රධානීන් (15)

අරමුණ : රාජ්‍ය අංශයට බඳවා ගන්නා ලද උපාධිධාරීන්ගේ සමීක්ෂණ දත්ත පදනම් කර ගනිමින් ආයතන ප්‍රධානීන් ලෙස ඔවුන්ගේ අත්දැකීම්, යෝජනා නිර්දේශයන් ලබා ගැනීම.

ප්‍රතිඵල : 01. උපාධිධාරීන්ගේ බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් වීම.

02. පවත්නා තත්වය (උපාධිධාරීන්ගේ රැකියා අතෘප්තිය) වෙනස් කර ගැනීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් වීම.



| 03) | දිනය | 2013/12/26 |
|---|---|---|
| | ස්ථානය | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිජන පර්යේෂණ සහ පුහුණු ආයතනය |
| | සහභාගිවූවන් | උපාධිධාරීන් සහ ආයතන ප්‍රධානීන් (30) |
| | අරමුණ | අවසාන වශයෙන් අපගේ සමීක්ෂණ ප්‍රතිඵල පදනම් කර ගනිමින් ඉදිරිපත් කිරීමට යෝජිත නිර්දේශයන් සඳහා තවදුරටත් අදහස් ලබා ගැනීම. |
| | ප්‍රතිඵල | අපගේ නිර්දේශ තවදුරටත් නිශ්චිත කර ගැනීම සඳහා අවශ්‍ය යෝජනා ඉදිරිපත් වීම. එමඟින් අවසාන පර්යේෂණ වාර්තා නිර්දේශ දියුණු කර ගත නොහැකිවීම. |



**<u>පර්යේෂණ ප්‍රතිඵල</u>**

| අංශය | ප්‍රතිඵල | |
|---|---|---|
| | ඔව් | නැත |
| 01 බඳවා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ තෘප්තිමත් වේ. | 52.1% | 47.9% |
| 02 පැරණි බඳවා ගැනීමේ ක්‍රමවේදයට නැවත ක්‍රියාත්මක කිරීමට එකඟ වේ. | 22% | 78% |
| 03 ඔබගේ රැකියාව වෘත්තීය අධ්‍යාපනය සමඟ ගැළපේ. | 59% | 41% |

04. රැකියා පිළිබඳ අතෘප්තිමත් වීමට හේතු

| අනු අංකය | හේතු | ප්‍රතිශතය |
|---|---|---|
| 01 | උපාධියට අනුව බඳවා ගැනීම් සිදු නොවීම. | 43% |
| 02 | දේශපාලන මැදිහත්වීම් | 33% |
| 03 | පවත්නා පහසුකම්වලට පරිබාහිරව බඳවා ගැනීම. | 8% |
| 04 | අභ්‍යන්තර/බාහිර උපාධිධාරීන් ලෙස නොසැළකීම. | 7% |
| 05 | අධ්‍යාපනික සුදුසුකම් නොසැළකීම. | 4% |
| 06 | රැකියා විෂයානුකූල නොවීම. | 3% |
| 07 | නිශ්චිත ක්‍රමවේදයක් නොමැතිවීම. | 2% |

05 ඉදිරි බඳවා ගැනීම් සඳහා යෝජනා

| අනු අංකය | හේතු | ප්‍රතිශතය |
|---|---|---|
| 01 | දේශපාලන මැදිහත්වීම් ඉවත් කිරීම. | 30% |
| 02 | පවත්නා පුරප්පාඩුවලට අනුයුක්ත කිරීම. | 23% |
| 03 | විභාග පවත්වා බඳවා ගැනීම. | 20% |
| 04 | ඉහළ අධ්‍යාපන වටිනාකමක් දීම. | 16% |
| 05 | අධ්‍යාපනික සුදුසුකම් අනුව අනුයුක්ත කිරීම. | 8% |
| 06 | වාර්ෂිකව බඳවා ගැනීම. | 3% |

**<u>NHRDC නිර්දේශ</u>**

01. රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ බඳවා ගැනීම් සඳහා දත්ත පද්ධතියක් සකස් කළ යුතු වේ. මෙම දත්ත පද්ධතියට උපාධිය යටත් වන උපාධිධාරීන් විශ්ව විද්‍යාල මඟින් ලියාපදිංචි විය යුතුය. එමෙන්ම රාජ්‍ය හා පෞද්ගලික අංශයෙන් තමන් සතුව පවත්නා ඉදිරි පුරප්පාඩු මෙම දත්ත පද්ධතියට ඇතුළත් කොට ඒවා අදාළ රාජ්‍ය අංශයත් සහ පෞද්ගලික අංශයත් යාවත්කාලීක කළ යුතු වේ. එමෙන්ම එහි පුරප්පාඩුවට අදාළ අධ්‍යාපනික සුදුසුකම් බඳවා ගැනීමේ පටිපාටිය, වැටුප ආදී වශයෙන් අත්‍යවශ්‍ය තොරතුරුද ඇතුළත් විය යුතුය. එමෙන්ම අභ්‍යන්තර ශ්‍රම වෙළඳපොළේ තොරතුරුද මෙයට ඇතුළත් විය යුතු වේ.

මීට අමතරව දැනට රාජ්‍ය අංශයේ සේවා නියුක්ත උපාධිධාරීන් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කොට ප්‍රධාන දත්ත පද්ධතිය සමඟ එය සම්බන්ධ කළ යුතු වේ.

- ❖ වගකීම : රාජ්‍ය පරිපාලන හා ස්වදේශිය කටයුතු අමාත්‍යාංශය
- ❖ සම්බන්ධීකරණය : රාජ්‍ය කළමනාකරණ සහ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
- ❖ විපරම් කිරීම : මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

02. රාජ්‍ය අංශයේ දැනට සේවා නියුක්තව සිටින රාජ්‍ය නිලධාරීන්ට අවශ්‍ය පුහුණුව ලබා දීම.

A) නිලාරම්භක පුහුණුව

රාජ්‍ය අංශයට බඳවා ගන්නා ඕනෑම උපාධිධාරියෙකුට මෙම පුහුණුව ලබා දිය යුතුයි. එමඟින් ආවරණය විය යුතු අංශ ලෙස ආකල්ප, භාෂාව, කුසලතා, තොරතුරු තාක්ෂණය, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, කාර්යාල කළමනාකරණය, ඵලදායිතාවය යන තත්ව දියුණු කිරීම තෘප්තිමත් කිරීම යනාදියයි.

B) විෂය ආශ්‍රිත පුහුණුව

අනුයුක්ත වන විෂයට අනුකූලව උපාධිධාරීන්ට පුහුණුව ලබා දීම.

C) ආකල්ප සංවර්ධන පුහුණුව


- ❖ වගකීම : රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
- ❖ සම්බන්ධීකරණය : SLIDA
- ❖ විපරම් කිරීම : මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

### 6.3 පාසැල් හැරයන සිසුන් සවිබල ගැන්වීමේ සමාජ සත්කාරක වැඩසටහන

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍ය, ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමාගේ සංකල්පයකට අනුව මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව මගින් පාසැල් හැරයන සිසුන් සවිබල ගැන්වීමේ අරමුණින් තෝරාගත් දිස්ත්‍රික්ක කීපයක එනම් මඩකලපුව, අම්පාර, මාතර, රත්නපුරය, කෑගල්ල, පුත්තලම හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක වල අමාත්‍යාංශය යටතේ ඇති වෘත්තීය පුහුණු ආයතනවල සහයෝගය ඇතිව වෘත්තීය මාර්ගෝපදේශන වැඩමුළු පැවැත් විය.

දැයට කිරුළ වැඩසටහනට සමගාමීව කෑගල්ල, කුරුණෑගල හා පුත්තලම යන දිස්ත්‍රික්ක වල මෙම වැඩමුළු පවත්වන ලදී. මෙම සිසුන් තෝරාගනු ලැබුයේ 2012 වර්ෂයේ අපොස(සා.පෙළ) හා (උ.පෙළ) අසමත් ළමුන් ලිපි මගින් දැනුවත් කිරීමෙන් හා එම දිස්ත්‍රික්කවල ග්‍රාම නිලධාරින්, නිපුණතා සංවර්ධන නිලධාරීන් මගින්ද ඔවුන් දැනුවත් කරන ලදී.

සෑම වැඩමුළුවක් අවසානයේදීම සිසුන්ගේ කැමැත්ත පරිදි වෘත්තීය පුහුණු පාඨමාලා හැදෑරීම සඳහා අමාත්‍යාංශය යටතේ ඇති පුහුණු ආයතන මගින් ඔවුන්ව ලියාපදිංචි කර ගන්නා ලදී.




මීට අමතරව ප්‍රශ්ණාවලියක් හරහා එම වැඩමුළුවලට සහභාගි වූ සිසුන් පිළිබඳ සමීක්ෂණයක් සිදු කරන ලදී.

වැඩමුළුව පැවැත්වූ දින පළුක් එක් වෘත්තීය පුහුණු ආයතනයේ ලියාපදිංචි වූ සංඛ්‍යාව

| දිස්ත්‍රික්කය | පැවැත්වූ දිනය | පැවැත්වූ ස්ථානය | සහභාගි වූ සංඛ්‍යාව | එක් එක් වෘත්තීය පුහුණු ආයතනයේ ලියාපදිංචි වූ සංඛ්‍යාව | | | | | | ලියාපදිංචි වූ මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | VTA | NAITA | NIFNE | DTET | NYSC | CGTTI | |
| මඩකලපුව | **24.01.2013** | වින්සන්ට් උසස් බාලිකා විද්‍යාලය, මඩකලපුව | 700 | 274 | 203 | 94 | 88 | 34 | - | 693 |
| අම්පාර (සිංහල හා දෙමළ මාධ්‍ය) | **29.05.2013**<br>**30.05.2013** | කාර්මික විද්‍යාලය, සමන්තුරේ<br>නගර ශාලාව, අම්පාර | 324 | 55 | 60 | 87 | 5 | 7 | - | 214 |
| මාතර | **27.07.2013** | කාර්මික විද්‍යාලය, මැද්දවත්ත | 704 | 95 | 95 | 66 | 45 | 0 | - | 301 |
| රත්නපුර | **28.09.2013** | පලාත් සභා සංකීර්ණය, රත්නපුර | 581 | 31 | 96 | 63 | 67 | 41 | 07 | 305 |
| කෑගල්ල | **25.10.2013** | ශාන්ත ජෝශප් බාලිකා ප්‍රාතමික විදුහල, කෑගල්ල | 167 | 35 | 27 | 0 | 30 | 39 | 05 | 136 |
| පුත්තලම | **21.11.2013** | සුදසුන ශාලාව | 191 | 57 | 39 | 08 | 18 | 16 | 04 | 142 |
| කුරුණෑගල | **30.11.2013** | දුටුගැමුණු මධ්‍ය මහා විද්‍යාලය, පොතුහැර | 263 | 30 | 25 | 5 | 8 | 9 | - | 77 |
| මුළු එකතුව | | | | 577 | 545 | 323 | 261 | 146 | 16 | 1868 |

**පාසැල් හැරයන්නන් සම්බන්ධ අධ්‍යයනය**

**i. අධ්‍යයනයේ අරමුණ**

අ.පො.ස. සා. පෙළ සහ උ.පෙළ විභාග අසමත්වීම සහ වෘත්තීය පුහුණු පාඨමාලා නොහැදෑරීම සඳහා හේතුවන කරුණු හඳුනා ගැනීම සහ වෘත්තීය පුහුණු පාඨමාලා හදාරන සිසුන් සංඛ්‍යාව වැඩි කිරීම පිණිස යෝජනා ඉදිරිපත් කිරීම.

**ii. අධ්‍යයන ක්ෂේත්‍ර**

2013 වසරේ අ.පො.ස සා.පෙ සහ උ.පෙ අසමත් වූවන් සඳහා මෙම සමීක්ෂණ සිදුකරන ලදී.

මෙම දිස්ත්‍රික්ක අතුරින් මාතර, රත්නපුර, කෑගල්ල, පුත්තලම සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල සහභාගිවූවන් සඳහා ප්‍රශ්නාවලි සපයා දෙමින් පාසල් යන අතරතුර ඇතිවූ බාධාවන්, උසස් අධ්‍යාපනය තෝරා නොගැනීමට හේතු සහ විභාග අසමත්වීම සඳහා හේතු සොයාගනු වස් සමීක්ෂණ පවත්වන ලදී.

ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව විසින් මාතර, රත්නපුර සහ කෑගල්ල යන දිස්ත්‍රික්කවල සහභාගිවූවන් සඳහා ප්‍රශ්නාවලි 1452ක් දැනටමත් බෙදා දී තිබේ. ඒවා අතරින්,සම්පූර්ණ කරන ලද ප්‍රශ්නාවලි 1051ක් ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව වෙත ලැබුනු අතර, ඒ මත පදනම්ව විශ්ලේෂණයන් සිදුකරන ලදී.

අ.පො.ස.(සා.පෙ), අ.පො.ස. (උ.පෙ.) හෝ උසස් අධයාපනය හැදෑරීමට නොහැකි වූ පාසල් හැරයන්නන් සඳහා බලපාන ලද සාධක හඳුනාගැනීම සඳහා මූලික දත්ත ප්‍රශ්නාවලි මඟින් රැස්කර ගන්නා ලදී.

**පහත දැක්වෙන්නේ අධ්‍යයනයේ සොයා ගැනීම්ය.**

**වෘත්තීය පුහුණුවක් හෝ කිසියම් පාඨමාලාවක් සඳහා ලියාපදිංචි නොවීම සඳහා හේතු**

- පාඨමාලා සම්බන්ධ දැනුවත්භාවය අඩුවීම
- මධ්‍යස්ථාන පිහිටා ඇත්තේ ජීවත්වන ප්‍රදේශයෙන් බොහෝ දුරබැහැර වීම
- දරිද්‍රතාවය සහ මූල්‍ය දුෂ්කරතාවයන්
- දරිද්‍රතාවය හේතුවෙන් රැකියාවක් කරන ලෙසට දෙමව්පියන් විසින් බලකිරීම
- ප්‍රවාහන දුෂ්කරතාවයන්
- වඩා කැමති පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ප්‍රමාණවත් නොවීම

**සොයාගැනීම්වල නිගමනය**

- ග්‍රාමීය තරුණයින් අදාළ වෘත්තීය පුහුණු .මධ්‍යස්ථානවලට අනුයුක්ත කිරීම පිණිස නිසි සමාජ අලෙවිකරණ පද්ධතියක් නොපැවතීම

- අදාළ අපේක්ෂකයින් සඳහා නිසි වෘත්තීය කර්මාන්තයන් සොයාගැනීම සහ අදාළ වෘත්තීය මාර්ග කරා මඟ පෙන්වීම පිණිස අවශ්‍ය දේ පවත්නා වෘත්තීය මාර්ගෝපදේශ පද්ධතියෙහි ද අන්තර්ගත නොවීම

- ජා.වෘ.සු. මට්ටම් 1- 7 දක්වා ඉහළට ගමන් කිරීම වැනි වෘත්තීය නඟා සිටුවීම් කරා සිසුන් මෙහෙයවීම සඳහා අධීක්ෂණ, ඇගයුම් සහ අධ්‍යාපන පද්ධතියක් නොමැති වීම.

- සුදුසු පුහුණු මධ්‍යස්ථාන නොමැතිවීම,. පුහුණුව සපයන්නන් විසින් සපයනු ලබන සේවාවේ අතෘප්තකර බව, ප්‍රවාහන දුෂ්කරතාවයන් සහ නොදැනුවත්බව

**2013.04.03 දින පැවති පාසැල් හැරයන්නන්ගේ වැඩසටහන පිළිබඳ සමුළුවට සහභාගි වූ නිලධාරීන් විසින් ලබ දී ඇති නිර්දේශ**

1. පාසැල් හැරයන්නන්ගේ සැබෑ පුහුණු අවශ්‍යතාව හඳුනාගත යුතුය.
2. පෞද්ගලික රැකියා ප්‍රකට කිරීම
3. රැකියා සුරක්ෂිතතාව - රක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වාදීම
4. සියුම් කුසලතා සංවර්ධන වැසටහන් හඳුනාගැනීම
5. මූල්‍ය කළමණාකරනය පිළිබඳ දැනුවත් වීම
6. උපයන අතර ඉගෙනීම යන සංකල්පය හඳුන්වාදීම
7. පුහුණු ආයතනවල ගුණාත්මක බව වර්ධනය කිරීම
8. පාසැල්වල දී වෘත්තීය පුහුණුව පිළිබඳ දැනුවත්කිරීමේ මාර්ග හඳුන්වා දීම
9. මෙම වෘත්තීය පුහුණු පාඨමාලාවලින් පසුව ලබාගත හැකි රැකියා අවස්ථා පිළිබඳ ඔවුන්ව දැනුවත් කිරීම
10. ධනාත්මක චින්තනය කරා ඔවුන් පුහුණු කිරීම
11. ප්‍රවර්තන වෘත්තීය මාර්ගෝපදේශන පද්ධතිය වැඩි දියුණු කිරීම
12. ජාතික නිපුණතා ප්‍රමිතීන් නංවාලීම
13. පාසැල් සහ සේවා වටපිටාව අතර නොගැලපීම අඩුකිරීම
14. මාධ්‍ය සහ තරුණ සමාජ හරහා වෘත්තීය පුහුණුව සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කිරීම

15. වෘත්තීය සම්බන්ධ දෙමව්පියන්ගේ සෘණාත්මක අදහස් වෙනස් කිරීම සඳහා පාසැල් සහ මාධ්‍ය මඟින් දැනුවත්භාවය ඇතිකිරීමේ වැඩසටහන් වැඩියෙන් ක්‍රියාත්මක කළ යුතු වේ.

16. අලුතින් හඳුන්වා දුන් විශ්ව විද්‍යාල ශාස්ත්‍රාල පද්ධතිය පිළිබඳ සියලු පාසැල් සිසුන් දැනුවත් කළ යුතුය.

**ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවේ නිර්දේශ**

- ප්‍රවර්තන දේශීය හා විදේශීය රැකියා වෙළඳපල ඉලක්ක කර ගනිමින් ස්වාධීන වෘත්තීය පුහුණු පාඨමාලා ඇතිකිරීම
- ප්‍රදේශයේ තරුණයින්ගේ අවශ්‍යතා ඉලක්ක කරගනිමින් වෘත්තීය පුහුණු පාඨමාලා වැඩි වශයෙන් ඇති කිරීම
- අ.පො.ස. (සා.පෙ) සහ අ.පො.ස. (උ.පෙ.) ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින සිසුක් ඉලක්ක කරගනිමින් කෙටි කාලීන පාඨමාලා ( මාස 3-4) ආරම්භ කළ යුතුය. උදා. ඉංග්‍රීසි, පරිගණක පාඨමාලා
- සෑම වසරකම සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග අවසානයේ දී සමාජ අලෙවිකරණ වැඩසටහන් සංවිධානය කිරීමට යෝජනා කෙරේ.
- සියලුම පුහුණු සපයන්නන්ගේ සහභාගිත්වය ඇතිව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් වෘත්තීය මාර්ගෝපදේශන සම්මන්ත්‍රණ පැවැත්විය යුතුය.
- පුහුණුවන්නන් අධීක්ෂණය කිරීම සහ දැනුවත් කිරීම පිණිස ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 1 සිට 7 දක්වා වන පරිදි ප්‍රවර්තන වෘත්තීය මාර්ගෝපදේශන පද්ධතිය ඉහළ නැංවිය යුතු වේ.
- මෙහිදී සෑම පුහුණුකරුවකුගේම වෘත්තීය සංවර්ධනය මෙන්ම සේවා නියුක්තිතාවය සම්බන්ධයෙන් මඟ පෙන්වීම සහ අධීක්ෂණය කිරීම සඳහා නිසි කළමනාකරණ තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ .
- ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 1 - 7 පද්ධතිය පිළිබඳව සිසුන්ව මෙන්ම පාසැල් මට්ටමින් දෙමව්පියන්ව දැනුවත් කිරීම
- සාධාරණ මිළකින් යුතු වාර ප්‍රවේශපත්‍රයකින් යුත් විශේෂ බස් සේවාවක් සූදානම් කළ යුතුය.
- අවම වශයෙන් දරිද්‍රතාවයෙන් පෙළෙන සිසුන් සඳහා දුම්රිය දීමනාවක් ගෙවිය යුතු වේ.
- මූල්‍ය ගැටළු අඩුකිරීම සඳහා උපයන අතරම ඉගෙනුම යන පද්ධතිය හඳුන්වා දිය යුතුය.
- ආයතනවලින් වඩා දුර බැහැර සිටින්නන් සඳහා නේවාසික පහසුකම් සූදානම් කළ යුතුය.
- පෞද්ගලික රාජ්‍ය සම්බන්ධතාවය ක්‍රියාත්මක කිරීම(PPP)

**iii. ප්‍රතිඵලය**

අධ්‍යයන වාර්තාව සකස් කර ඇති අතර, ඉදිරි දිනවල දී ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.

## 6.4 දැයට කිරුළ

දැයට කිරුළ වැඩසටහනට සමගාමීව මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව පාසල් දරුවන්ගේ කායික හා මානසික සෞඛ්‍ය නංවාලීමේ වැඩමුළු මාලාවක් පවත්වනු ලැබිය. 2014 වර්ෂයේ දැයට කිරුළ පැවැත්විමට නියමිතව තිබු පුත්තලම කෑගල්ල හා කුරුණෑගල දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් උක්ත වැඩමුළු 2013 වර්ෂයේදී සංවිධානය කරනු ලැබිය. මෙහිදි තෝරා ගත් පාසල් තුනක පාසල් දරුවන්ගේ කායික මානසික සෞඛ්‍ය නංවාලිමේ දේශන ප්‍රවීන සම්පත්දායකයන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකරනු ලැබිය.

ප්‍රධාන අංශ තුනක් පදනම් කර ගනිමින් මෙම දේශන පවත්වනු ලැබිය එම අංශ පහත පරිදි දැක්විය හැක.

1. මානසික ආතතිය
2. මත් ද්‍රව්‍යවල අහිතකර ප්‍රතිවිපාක
3. කාබනික ආහාර භාවිතයේ  වැදගත්කම

මෙම දේශන පැවැත්වීම සඳහා තෝරා ගනු ලැබු පාසල් -

- කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මාබෝපිටිය මහා විද්‍යාලය
- කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් වටරැක මහාවිද්‍යාලය
- පුත්තලම දිස්ත්‍රික්කය නියෝජනය කරමින් කාමෙල් බාලිකා විද්‍යාලය

ඉහත පාසල් වලින් මෙම වැඩමුළුව සඳහා සහභාගි වු දරුවන් සංඛ්‍යාව පහත පරිදි දැක්විය හැක.

| පාසල | සහභාගි වු දරුවන් සංඛ්‍යාව |
|---|---|
| මාබෝපිටිය මහා විද්‍යාලය | 250 |
| වටරැක මහාවිද්‍යාලය | 288 |
| කාමෙල් බාලිකා විද්‍යාලය | 360 |

**මාබෝපිටිය මහා විද්‍යාලයේ පැවති වැඩමුළුව 2013.10.10**

මානසික ආතතිය සම්බන්ධව ආචාර්ය තුලිත වික්‍රම මහතා විසින් දේශනය සිදු කළ අතර එහිදි ප්‍රායෝගික කණ්ඩායම් ක්‍රියාකාරකම් ඇසුරෙන්ද මානසික ආතතිය සම්බන්ධව අවබෝධය ලබා දෙන ලදි. මත් ද්‍රව්‍ය සම්බන්ධව දේශනය සිදු කරනු ලැබුවේ අත්තරායක ඖෂද නිවාරණ ජාතික මණ්ඩලය නියෝජනය කරමින් පැම්ණි මංගලා සී ජයතිලක මහත්මියයි. එසේම රසායනික ආහාර ගැනිමේ භයානකකම සහ දරුවන්ගේ පෝෂණය සම්බන්ධව කෘෂිකාර්මික අධ්‍යාපනයේ අත්දැකිම් බහුල

කථිකාචාර්ය එස්.බී.එ.එම්.ඒ. ගුණවර්ධන මහත්මිය දේශන පවත්වනු ලැබිය. පහසුකම් අවම දුෂ්කර පාසලක් වූ මෙම පාසල තුළ මෙවැනි වැඩමුළුවක් දියත් කර තිබූ පළමු අවස්ථාව මෙය වීම විශේෂත්වයක් විය.

**වටරැක මහා විද්‍යාලයේ පැවති වැඩමුළුව 2013.12.05**

මාබෝපිටිය මහා විද්‍යාලයෙන් ලබා ගත් අත්දැකීම් සමග වටරැක මහා විද්‍යාලයේදිත් උක්ත වැඩමුළුව පවත්වනු ලැබිය. මෙහිදී මානසික සෞඛ්‍ය සම්බන්ධවත් මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රතිවිපාක සම්බන්ධවත් පාසල් දරුවන් දැනුවත් කළ අතර මෙයට අමතරව සයිබ අවකාශයේ භයානක බව සම්බන්ධ දේශනයක්ද පවත්වනු ලැබිය. මෙම සියලු දේශන මානව සම්පත් සංවර්ධනය කිරිමේ ජාතික සභාවේ නිලධාරින් විසින් පැවැත්විම විශේෂත්වයයි.

**කාමෙල් බාලිකා විද්‍යාලයේ පැවැත්වූ වැඩමුළුව 2013.12.02**

ඉහත ආකාරයෙන්ම වැඩමුළුවක් ඉතා සාර්ථකව මෙම පාසල තුළද පවත්වන්නට හැකිවිය.

මෙම වැඩමුළු ත්‍රිත්වයම ඉතා සාර්ථකව පැවැත්වූ අතර විදුහල්පතිවරුන්ගේත් ගුරුභවතුන්ගේත් දරුවන්ගේත් ඉතා යහපත් ප්‍රතිචාර ලබා ගන්නට අපට හැකි විය.

**සයිබ අවකාශයේ ඇති භයානක පැතිකඩ පිළිබඳ පාසැල් ළමුන් දැනුවත් කිරීමේ වැඩමුළුව**

දැයට කිරුළ වැඩසටහනට සමගාමීව කැගල්ල, පුත්තලම හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක තුනෙහි පහත දක්වා ඇති තෝරාගත් පාසැල් තුනෙහි සයිබ අවකාශයේ ඇති භයානක පැතිකඩ පිළිබඳ පාසැල් ළමුන් දැනුවත් කිරීමේ වැඩමුළු පවත්වන ලදී.

ස්වර්ණ ජයන්ති මහා විද්‍යාලය, කෑගල්ල දිස්ත්‍රික්කය

කාමෙල් බාලිකා විද්‍යාලය, පුත්තලම දිස්ත්‍රික්කය පැවැත්වූ වැඩමුළුව 2013.12.02

වටරැක මහා විද්‍යාලය, මාවතගම කුරුණෑගල දිස්ත්‍රික්කය පැවති වැඩමුළුව 2013.12.05

<u>මානව සම්පත් සංවර්ධන වැඩසටහන</u>

දැයට කිරුළ වැඩසටහනට සමාන්තරව කුරුණෑගල සහ කෑගල්ල දිස්ත්‍රික්කයන්හි රාජ්‍ය සේවකයින් සඳහා ද පුත්තලම දිස්ත්‍රික්කයේ අලුතින් බඳවාගත් උපාධිධාරීන් සඳහා ද මානව සම්පත් සංවර්ධන වැඩසටහන්පවත්වන ලදී.

**6.5 වෘත්තීය මාර්ගෝපදේශන පද්ධතියක් සකස් කිරිම**

ලෝකයේ ශ්‍රම ඉල්ලුමට ගැලපෙන වෘත්තීය දැනුමෙන් පරිපූර්ණ තරුණ පරපුරක් ශ්‍රී ලංකාව තුළ සිටිනවාද යන්න දිගු කාලයක් පුරාවට විවාදයට තුඩු දුන් කරුණකි. එයට මුලික හේතුව වී ඇත්තේ වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳව ලැබෙන දැනුමේ අඩුපාඩුව බව මුලිකවම කිව හැක.

ශ්‍රී ලංකාවේ පාසල් වලට සහ වෘත්තීය ප්‍රහුණු ආයතන වලට වෘත්තීය මාර්ගෝපදේශන පද්ධතියක් සකස් කිරිම උදෙසා මානව සම්පත් සංවර්ධනය කිරිමේ ශ්‍රී ලංකා ජාතික සභාව ටෙන්ඩර් ක්‍රමයට තෝරා ගත් බාහිර පුද්ගලයෙකු හරහා දිවයිනේ පාසල් විශ්ව විද්‍යාල සහ වෘත්තීය පුහුණු ආයතන කේන්ද්‍ර කර ගනිමින් පර්යේෂණයක් සිදු කරනු ලැබූ අතර එහි පර්යේෂණ වාර්තාව 2012 දෙසැම්බර් මසදි ලබා ගැනිමට හැකි විය. අවසාන පර්යේෂණ වාර්තාව ලබා ගැනිමට පෙර 2013 නොවැම්බර් මස 22 වන දින මානව සම්පත් සංවර්ධනය කිරිමේ ජාතික සභාවේ ශ්‍රවණාගාරයේදි වැඩමුළුවක්ද පැවැත්වූ අතර ඒ සඳහා විශ්ව විද්‍යාල පාසල් මෙන්ම යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට අනුබද්ධිත බොහෝ වෘත්තීය පුහුණු ආයතන නියෝජනය කරමින් නිලධාරි මහත්ම මහත්මින් සහභාගි විය. ඔවුන්ගෙන් ලැබුනු වටිනා අදහස් සහ යෝජනාද පර්යේෂණ වාර්තාව සඳහා පදනම් කරගෙන ඇත.

**6.6 විද්යුත් ලේඛන ක්‍රමයක් හා දත්ත පද්ධතියක් හඳුන්වාදීම**

අප ආයතනය සංස්ථාපනය කළ පනතේ 16(2) (ඊ) වගන්තිය පරිදි මානව සම්පත් සංවර්ධනයට අදාල දත්ත පද්ධතියක් පවත්වා ගත යුතුය. ඒ අනුව විශේෂයෙන්ම පාසැල් හැරයන සියළු දරු දැරියන්ව ලියා පදිංචි විය හැකි දත්ත පද්ධතියක් www.nhrdc.gov.lk/index.php නමින් ආරම්භ කරන ලදි. මෙම දත්ත පද්ධතිය තුල ලියාපදිංචිවන දරු දැරියන්ට ඒ මගින් වෘත්තීය පුහුණුවක් හෝ රැකියාවක් සොයා ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලැබෙන අතර වෘත්තීය පුහුණු ආයතන වලට අමතර ප්‍රචාරණ පිරිවැයකින් තොරව වෘත්තීය පුහුණුව සඳහා සිසුන් තෝරාගත හැක. එසේම තනතුරු පුරප්පාඩු සඳහා යෝග්‍යතම අයදුම්කරුවන් මේ මගින් තෝරාගැනීමට රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයටම අවස්ථාව සැලසේ. දිවයිනේ පාසැල් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල සම්බන්ධ කරගෙන පාසැල් හැරගිය සියළු තරුණ තරුණියන් මෙම දත්ත පද්ධතිය තුළ ලියාපදංචි කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

තොරතුරු තාක්ෂණය දිනෙන් දින ඉහළ සංවර්ධනයක් කරා යන යුගයක සාම්ප්‍රදායික ලිපි ගොනු හා ලිපි සැකසීමේ ක්‍රමය වෙනුවට විද්යුත් ලේඛන කළමනාකරණ ක්‍රමයක්ද හඳුන්වා දුනිමු. ඒ යටතේ ලිපියක කෙටුම්පතක් මුද්‍රණය නොකර අදාල නිලධාරියා මෘදුකාංග පිටපතක් ලෙස ඉදිරිපත් කිරීමටත් සියළු ලිපිගොනු සටහන්පත්‍ර හා ලිපි මේ මගින් ඉදිරිපත්කර අත්සනද විද්යුත් ක්‍රමය මගින් ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇත. ඒ සඳහා අවශ්‍ය සියළු උපකරණ දැනට මිලට ගනිමින් පවතින අතර 2014 වර්ෂය තුල මුළුමනින්ම කඩදාසි භාවිතයෙන් තොර කාර්යාල කළමනාකරණ ක්‍රමවේදයෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

## **6.7 වෙබ් අඩවිය** www.nhrdc.gov.lk/index.php

වෘත්තීය පුහුණු සේවාවන් කරා ප්‍රවේශය අපේක්ෂා කරන පාසැල් හැරයන්නන්ට සහ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවත්නා සමහරක් පුහුණු ආයතනවලට යන දෙපිරිසටම ප්‍රතිලාභ හිමිවන සේ දත්ත පද්ධතියක් ස්ථාපනය කරන ලදී. මේ අවස්ථාව වනවිට පාසැල් හැරගියවුන් 1065 ක සංඛ්‍යාවක් මෙම වෙබ් අඩවියේ ලියාපදිංචි වී ඇත.

## **6.7 පුවත්ලිපිය පළකිරීම**

ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව (NHRDC) විසින් ත්‍රෛමාසිකව පුවත්පත් ලිපියක් පළකරනු ලබයි. මෙම පුවත් ලිපිය හරහා ආයතන, කර්මාන්ත සහ තරුණයින් අතර තොරතුරු ලැබීම්වල පවත්නා හිඩැස පුරවනු ලබයි. 2013 අගෝස්තු මස පළමු ප්‍රකාශනය යටතේ පුවත්පත් ලිපියෙහි පිටපත් දහසක් නිකුත් කරන ලදී. මෙම වසරේ දෙවන මුද්‍රණය පිටපත් පන්සියයකින් යුතුව දෙසැම්බර් මස පළ කරන ලදී.

ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව

## 7. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

**2013 දෙසැම්බර් 31 දිනට**

| | සටහන | 2013 | 2012 | ශ්‍රී.ල.රු. අයවැයගත |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම වත්කම්** | | | | |
| මුදල් හා මුදල් හා සමාන දේ | 1 | 1,378,053.62 | 3,373,266.14 | 833,837.13 |
| ලැබිය යුතු දෑ | 2 | 250,561.50 | 1,770.00 | - |
| භාණ්ඩ ලේඛණ | 3 | 337,705.74 | 90,131.45 | 345,000.00 |
| කලින් ගෙවීම් | 4 | 129,860.00 | - | 150,000.00 |
| අනිකුත් ජංගම වත්කම් | 5 | 1,225,421.67 | 1,327,114.59 | 1,359,000.00 |
| | | 3,321,602.53 | 4,792,282.18 | 2,687,837.13 |
| **ජංගම - නොවන වත්කම්** | | | | |
| යටිතල පහසුකම්, පිරියත සහ උපකරණ | 6 | 6,716,617.92 | 3,355,235.28 | 6,800,000.00 |
| වාහන | 6 | 10,735,479.45 | 14,185,479.45 | 10,735,479.45 |
| අනිකුත් මූල්‍ය නොවන වත්කම් | 6 | 177,676.42 | 201,877.81 | 177,676.42 |
| | | 17,629,773.79 | 17,742,592.54 | 17,713,155.87 |
| **මුළු වත්කම්** | | **20,951,376.32** | **22,534,874.72** | **20,400,993.00** |
| **වගකීම්** | | | | |
| **ජංගම වගකීම්** | | | | |
| ගෙවීම් | 7 | 1,469,607.37 | 380,868.74 | 222,700.00 |
| කෙටි කාලීන ප්‍රතිපාදන | 8 | 241,162.82 | 170,000.00 | 85,000.00 |
| | | **1,710,770.19** | **550,868.74** | **307,700.00** |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| සේවක ප්‍රතිලාභ | 9 | 1,160,263.00 | 979,054.40 | 1,160,263.00 |
| | | **1,160,263.00** | **979,054.40** | **1,160,263.00** |
| **මූළු වත්කම්** | | **2,871,033.19** | **1,529,923.14** | **1,467,963.00** |
| **ශුද්ධ වත්කම්** | | **18,080,343.13** | **21,004,951.58** | **18,933,030.00** |
| **ශුද්ධ වත්කම්/සම කොටස** | | | | |
| <u>ප්‍රාග්ධන දායකත්වය</u> | | | | |
| දායක ප්‍රාග්ධනය | | 3,000,000.00 | 3,000,000.00 | 3,000,000.00 |
| සංචිත | | 1,833,030.00 | 1,833,030.00 | 1,833,030.00 |
| රාජ්‍ය ප්‍රධාන - ප්‍රාග්ධනය | | 17,583,167.18 | 20,898,715.40 | 17,000,000.00 |
| සමුච්චිත අතිරික්ත/(හිඟ) | | (4,335,854.05) | (4,726,793.82) | (2,900,000.00) |
| **මුළු ශුද්ධ වත්කම්/සම කොටස්** | | **18,080,343.13** | **21,004,951.58** | **18,933,030.00** |

සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)
දිනය

සභාපති
දිනය:

ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව (NHRDC)

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

**2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම**

ශ්‍රී.ල.රු.

| | සටහන | 2013 | 2012 | අයවැයගත |
|---|---|---|---|---|
| **ආදායම** | | | | |
| රාජ්‍ය ප්‍රදාන - පුනරාවර්තන | 10 | 13,780,000.00 | 9,350,000.00 | 14,000,000.00 |
| රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධනය | 11 | 11,595,548.22 | 13,651,947.40 | 12,848,000.00 |
| වත්කම් අපහරණ ලාභය | 12 | 13,085.00 | - | - |
| අනිකුත් ආදායම් | 13 | 67,516.85 | 85,090.25 | 71,000.00 |
| **මුළු ආදායම** | | **25,456,150.07** | **23,087,037.65** | **26,919,000.00** |
| **වියදම්** | | | | |
| වේතන, වැටුප් සහ සේවක ප්‍රතිලාභ | 14 | 9,325,037.70 | 4,942,719.50 | 9,311,208.60 |
| ප්‍රදාන සහ අනිකුත් නොඉපයූ ගෙවීම් | 15 | 7,334,149.51 | 10,015,639.03 | 8,530,000.00 |
| සැපයුම් සහ භාවිතා කළ පාරිභෝගික භාණ්ඩ | 16 | 342,636.52 | 434,921.47 | 395,000.00 |
| ක්ෂය කිරීම් සහ ක්‍රමක්ෂණ වියදම් | 6 | 4,318,600.74 | 4,003,384.37 | 4,400,000.00 |
| ප්‍රවාහන දීමනා සහ යැපුම් දීමනා | 17 | 308,720.00 | 310,087.50 | 363,600.00 |
| උපයෝගීතාව සහ සේවාවන් | 18 | 2,024,806.00 | 2,064,952.48 | 2,138,900.00 |
| නඩත්තු දීමනා | 19 | 1,154,670.58 | 1,072,819.30 | 1,427,900.00 |
| අනිකුත් දීමනා | 20 | 354,867.75 | 350,572.00 | 369,209.00 |
| **මුළු වියදම** | | **25,163,488.62** | **23,195,095.65** | **26,935,817.60** |
| **කාල සීමාව සඳහා අතිරික්තය/(හිඟය)** | | **292,661.45** | **(108,058.00)** | **(16,817.60)** |

ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව (NHRDC)

**ශුද්ධ වත්කම්/සම කොටස් වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය**

**2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා**

ශ්‍රී.ලංරු.

| | පාලන ආස්ථිතිවල හිමිකරුවන් සඳහා ආරෝපණයන් | | | | |
|---|---|---|---|---|---|
| | දායක ප්‍රාග්ධනය | සංචිත ප්‍රත්‍යාගණනය | රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධනය | සමුච්චිත අතිරික්ත/ හිඟ) | මුළු ශුද්ධ වත්කම/සම කොටස |
| 2012 ජනවාරිමසට ශේෂය ඉ/ගෙ | 3,000,000.00 | 1,833,030.00 | 18,366,178.79 | (4,973,518.32) | 18,225,690.47 |
| පූර්ව වර්ෂයේ ගැලපීම | - | - | - | 354,782.50 | 354,782.50 |
| දේපල විප්ලවන හානිය | - | - | - | - | - |
| කාල සීමාව සඳහා ශුද්ධ වත්කම/සම කොටස් හිභය/අතිරික්තයෙහි සාජුව හඳුනාගත් ශුද්ධ ආදායම | - | - | 6,180,844.98 | | 6,180,844.98 |
| ක්ෂය කිරීම w/o | - | - | (3,648,308.37) | 3,648,308.37 | - |
| කාල සීමාව සඳහා හිභය | - | - | - | (3,756,366.37) | (3,756,366.37) |
| කාලසීමාව සඳහා හඳුනාගත් මුළු ආදායම සහ වියදම | - | - | 2,532,536.61 | 246,724.50 | 2,779,261.11 |
| **2012 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙන ගිය ශේෂය** | **3,000,000.00** | **1,833,030.00** | **20,898,715.40** | **(4,726,793.82)** | **21,004,951.58** |
| 2012 දෙසැම්බර් 31 දිනට ඉ/ගෙන ආ ශේෂය | 3,000,000.00 | 1,833,030.00 | 20,898,715.40 | (4,726,793.82) | 21,004,951.58 |
| පූර්ව වර්ෂයේ ගැලපීම | - | - | | 98,278.32 | 98,278.32 |
| කාල සීමාව සඳහා ශුද්ධ වත්කම/සම කොටස් හිභය/අතිරික්තයෙහි සාජුව හඳුනාගත් ශුද්ධ ආදායම | - | - | 985,926.52 | - | 985,926.52 |
| ක්ෂය කිරීම w/o | - | - | (4,301,474.74) | - | (4,301,474.74) |
| කාල සීමාව සඳහා අතිරික්තය/හිභය | - | - | | 292,661.45 | 292,661.45 |
| කාල පරිච්ඡේදය සඳහා හඳුනාගත් මුළු ආදායම සහ වියදම | - | - | (3,315,548.22) | 390,939.77 | (2,924,608.45) |
| **2013 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙන ගිය ශේෂය** | **3,000,000.00** | **1,833,030.00** | **17,583,167.18** | **(4,335,854.05)** | **18,080,343.13** |

ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය**

| | 2013 | 2012 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාවලින්ගෙන් මූල්‍ය ප්‍රවාහයන්** | | |
| අතිරික්තය/(හිඟය) | 292,661.45 | (108,058.00) |
| <u>මූල්‍ය - නොවන සංචලනය</u> | | |
| ක්ෂයකිරීම | 4,318,600.74 | 4,003,384.37 |
| පාරිතෝෂිකය | 181,208.60 | 88,268.52 |
| පූර්ව වර්ෂයේ ගැලපීම | 98,278.32 | 354,782.50 |
| නාමික ක්ෂය කිරීම් ආදායම | (4,301,474.74) | (3,648,308.37) |
| කාර්ය මණ්ඩල ණය සඳහා පොළිය | (50,816.85) | - |
| විගණන ගාස්තුව | 79,289.00 | - |
| දේපළ, පිරියත සහ උපකරණ මත (ලැබීම්)/අලාභ | (13,085.00) | - |
| පාරිභෝගික ගබඩාවල වැඩිවීම් (අඩුවීම්) | (247,574.29) | (18,671.65) |
| කලින් ගෙවීම් වල වැඩිවීම් (අඩුවීම්) | (129,860.00) | 34,990.48 |
| කාර්ය මණ්ඩල ණය වල වැඩිවීම් (අඩුවීම්) | 94,753.42 | 490,338.06 |
| අනිකුත් අත්තිකාරම් වලවැඩිවීම් (අඩුවිම්) | 5,939.50 | 22,272.50 |
| ණයහිමියන්ගේ වැඩිවීම් (අඩුවීම්) | - | (3,000.00) |
| ගෙවිය යුතු දෑ වල වැඩිවීම් (අඩුවීම්) | 1,088,738.63 | (372,237.76) |
| කෙටි කාලීන ප්‍රතිපාදනවල වැඩිවීම් (අඩුවිම්) | 71,162.82 | - |
| අනිකුත් ජංගම වත්කම්වල ඉහළයාම | 1,000.00 | - |
| ලැබිය යුතු දෑ වල වැඩිවීම | (248,791.50) | - |
| ගෙවන ලද විගණන ගාස්තු | (79,289.00) | - |
| රාජ්‍ය ප්‍රදාන | 985,926.52 | 212,360.97 |
| **මෙහෙයුම් ක්‍රියාවන්ගෙන් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **2,146,667.62** | **1,056,121.62** |

**ආයෝජන ක්‍රියාවලින් මූල්‍ය ප්‍රවාහයන්**

| | | |
|---|---|---|
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් මිළ දී ගැනීම | (486,947.00) | (40,165.27) |
| කාර්යාල උපකරණ මිළදී ගැනීම | (854,636.00) | (120,228.00) |
| පරිගණක මිළ දී ගැනීම | (2,093,262.38) | (14,300.00) |
| වාහන මිළ දී ගැනීම | - | (3,486.00) |
| කාර්ය මණ්ඩල ණය සඳහා පොලිය | 50,816.85 | - |
| මෘදුකාංග මිළ දී ගැනීම | (770,556.61) | - |
| පොත් මිළ දී ගැනීම | (380.00) | - |
| පිරියත සහ උපකරණ අලෙවියෙන් ලබන මුදල් | 13,085.00 | - |
| **ආයෝජන ක්‍රියාවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **(4,141,880.14)** | **(178,179.27)** |

**මූල්‍ය ක්‍රියාවලින් මූල්‍ය ප්‍රවාහයන්**

**මූල්‍ය ක්‍රියාවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහයන්**

| | | |
|---|---|---|
| **මුදල් හා මුදල් හා සමාන දේවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)** | (1,995,212.52) | 877,942.35 |
| **කාලසීමාව ආරම්භයෙහි මුදල් හා මුදල් වලට සමාන දෑ** | 3,373,266.14 | 2,495,323.79 |
| **කාලසීමාව අවසානයේ දී මුදල් හා මුදල්වලට සමාන දෑ** | **1,378,053.62** | **3,373,266.14** |

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

අතැති මුදල් සහ බැංකුවල ඇති ශේෂය

| | | |
|---|---|---|
| මහජන බැංකුව ගි/අ 119100120409161 | 1,283,060.26 | 1,086,489.99 |
| ලංකා බැංකුව ගි/අ 165197 | 94,993.36 | 2,286,776.15 |
| | **1,378,053.62** | **3,373,266.14** |

සටහන්

| | | 2013 | 2012 | අයවැයගත |
|---|---|---|---|---|
| <u>මුදල් හා මුදල්වලට සමාන දෑ</u> | **1** | | | |
| මහජන බැංකු ගිණුම් අංක 119100120409161 | | 1,283,060.26 | 1,086,489.99 | 830,000.00 |
| ලංකා බැංකු ගිණුම- 165197 | | 94,993.36 | 2,286,776.15 | 3,837.13 |
| | | **1,378,053.62** | **3,373,266.14** | **833,837.13** |
| <u>ලැබිය යුතු දෑ</u> | **2** | | | |
| සීමා සහිත ජාතික කඩදාසි සමාගම | | 1,770.00 | 1,770.00 | - |
| ජාතික ධීවර හා නාවුක ඉන්ජිනේරු ආයතනය | | 110,284.63 | - | - |
| යෞවන කටයුතු සහ කුසලතා සංවර්ධන අමාත්‍යාංශය. | | 67,344.05 | - | - |
| නිමල් බෝපගේ (හිටපු සභාපති) | | 71,162.82 | - | |
| | | **250,561.50** | **1,770.00** | **-** |
| <u>භාණ්ඩ ලේඛණ</u> | **3** | | | |
| පාරිභෝගික භාණ්ඩ සංචිත | | 337,705.74 | 90,131.45 | 345,000.00 |
| | | **337,705.74** | **90,131.45** | **345,000.00** |
| <u>කලින් ගෙවීම්</u> | **4** | 129,860.00 | - | 150,000.00 |
| | | **129,860.00** | **-** | **150,000.00** |
| <u>අනිකුත් ජංගම වත්කම්</u> | **5** | | | |
| අනිකුත් අත්තිකාරම් | | 20,000.00 | 25,939.50 | - |
| කාර්ය මණ්ඩල ණය ආපදා | | 1,196,421.67 | 1,291,175.09 | 1,350,000.00 |
| උත්සව අත්තිකාරම් | | 9,000.00 | 10,000.00 | 9,000.00 |
| | | **1,225,421.67** | **1,327,114.59** | **1,359,000.00** |

## දේපල, පිරියත හා උපකරණ(සටහන් 06)

| | ගෘහ භාණ්ඩ හා සවි කිරීම් | | කාර්යාලයීය උපකරණ | | විදුලි උපකරණ | | පරිගණක | | මෘදුකාංග | | වාහන | | පොත් | | අනෙකුත් වත්කම් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වාර්තාගත කාල පරිච්ඡේදය **01.01.2013** සිට **31.12.2013** | **2013** | **2012** | **2013** | **2012** | **2013** | **2012** | **2013** | **2012** | **2013** | **2012** | **2013** | **2012** | **2013** | **2012** | **2013** | **2012** |
| ආරම්බක ශේෂය | 1,333,395.34 | 1,291,230.07 | 1,423,573.95 | 1,303,345.95 | 57,656.25 | 57,656.25 | 2,327,325.75 | 2,313,025.75 | - | - | 18,950,000.00 | 8,450,000.00 | 79,717.15 | 76,231.15 | 413,865.50 | 413,865.50 |
| එකතු කිරීම් | 486,947.00 | 40,165.27 | 854,636.00 | 120,228.00 | - | - | 2,093,262.38 | 14,300.00 | 770,556.61 | - | - | 10,500,000.00 | 380.00 | 3,486.00 | - | - |
| ගැලපීම් | 58,606.00 | - | - | - | - | - | 93,100.00 | - | - | - | - | - | - | - | - | - |
| ක්ෂය කිරීම් | (58,606.00) | - | - | - | - | - | (93,100.00) | - | - | - | - | - | - | - | - | - |
| **අවසාන ශේෂය** | 1,818,342.34 | 1,331,395.34 | 2,278,209.95 | 1,423,573.95 | 57,656.25 | 57,656.25 | 4,420,588.13 | 2,327,325.75 | 770,556.61 | - | 18,950,000.00 | 18,950,000.00 | 80,097.15 | 79,717.15 | 413,865.50 | 413,865.50 |
| සමුච්ජිත ක්ෂය (වර්ෂය ආරම්භය) | 238,498.15 | 114,475.54 | 326,573.19 | 201,683.32 | 17,457.65 | 16,237.65 | 1,202,187.02 | 878,520.43 | - | - | 4,764,520.55 | 1,360,000.00 | 73,469.36 | 73267.61 | 218,235.48 | 193,372.48 |
| ගැලපීම් | 58,606.00 | - | - | - | - | - | 93,100.00 | - | - | - | - | - | - | - | - | - |
| මූල්‍ය කාර්ය සාධන වාර්තාවට අනුව ක්ෂය | 157,850.14 | 124,022.61 | 143,733.80 | 124,889.87 | 2,720.00 | 1,222.00 | 527,856.28 | 323,666.59 | 11,859.13 | - | 3,450,000.00 | 3,404,520.55 | 578.39 | 201.75 | 24,003.00 | 24,863.00 |
| ප්‍රත්‍යාගණනය (ශුද්ධ) | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මුළු ප්‍රත්‍යාගණන අතිරික්තය/ ඌනතාවය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| අඩු කලා<br>ඉවත්කල වත්කම්වල සමුච්ජිත ක්ෂය | (58,606.00) | - | - | - | - | - | (93,100.00) | - | - | - | - | - | - | - | - | - |
| **අවසාන ශේෂය** | 396,348.29 | 238,498.15 | 470,306.99 | 326,573.19 | 20,177.65 | 17,457.65 | 1,730,043.30 | 1,202,187.02 | 11,859.13 | - | 8,214,520.55 | 4,764,520.55 | 74,047.75 | 73,469.36 | 242,238.48 | 218235.48 |
| **ඉදිරියට ගෙන එන ශුද්ධ වටිනාකම** | 1,421,994.05 | 1,092,897.19 | 1,807,902.96 | 1,097,000.76 | 37,478.60 | 40,198.60 | 2,690,544.83 | 1,125,138.73 | 758,697.48 | - | 10,735,479.45 | 14,185,479.45 | 6,049.40 | | 171,627.02 | 195630.02 |

**<u>ගෙවිය යුතු</u>** **7**

| | | | |
|---|---|---|---|
| රාජ්‍ය වෙළඳ සංස්ථාව. | 89,074.00 | - | - |
| අගනගර කාර්යාලය | 260,000.00 | - | - |
| MS තාක්ෂණයන් | 739,556.61 | - | - |
| හිමිකම් නොපෑ ගෙවිය යුතු | - | 53,055.00 | - |
| IWSS සමීක්ෂණය ගෙවිය යුතු | 4,580.57 | 4,580.57 | - |
| NVQ සහතික ලාභීන් - ගාල්ල | 19,000.00 | 19,000.00 | - |
| NVQ සහතික ලාභීන් - බෙලිඅත්ත | 6,000.00 | 6,000.00 | - |
| CADREP | 48,097.63 | 48,097.63 | - |
| වැටුප් සහ වේතන - NIFNI | 53,435.53 | 26,900.00 | - |
| ජීවන වියදම් දීමනාව | - | 11,700.00 | - |
| අන්තර් දීමනාව | - | 4,035.00 | - |
| සේ.අ.සා.අ. | - | 5,924.88 | - |
| සේ.භා.අ. | - | 1,481.22 | - |
| නිවාඩු දින ගෙවීම් | - | 1,081.00 | 2,400.00 |
| විදුලිය | - | 69,888.80 | 63,000.00 |
| ජලය | - | 3,346.38 | 3,000.00 |
| දුරකතන | 20,562.50 | 17,474.58 | 8,000.00 |
| සාමාන්‍ය නඩත්තු | | 1,761.92 | 2,000.00 |
| අන්තර්ජාලය | 1,096.73 | 7,326.77 | 2,000.00 |
| පුවත්පත් බිල්පත් | 2,440.00 | 1,230.00 | 1,300.00 |
| පර්යේෂණ අධ්‍යයන සහ සමීක්ෂණ | 82,562.33 | 46,789.48 | 90,000.00 |
| සම්මන්ත්‍රන සහ වැඩමුළු | - | 19,767.00 | - |
| - Traid මාධ්‍ය | | 20,074.96 | - |
| ගෙවිය යුතු දේශීය ගමන් ගාස්තු | 350.00 | 3,412.50 | - |
| දැයට කිරුළ ගෙවිය යුතු | 2,463.00 | - | - |

| | | | | |
|---|---|---|---|---|
| දත්ත පද්ධති ස්ථාපනය ගෙවිය යුතු | | 400.00 | - | - |
| ගෙවිය යුතු අනෙකුත් සේවාවන් | | 16,660.50 | - | 15,000.00 |
| වාහන අලුත්වැඩියාව සහ නඩත්තුව | | 12,425.00 | - | 4,000.00 |
| කාර්ය මන්ඩල පුහුණුව සහ සංවර්ධනය | | 27,000.00 | - | 8,000.00 |
| තාවකාලික වැටුප් | | 39,421.56 | - | 20,000.00 |
| අතිකාල දීමනා | | 11,552.00 | 7,941.05 | 4,000.00 |
| කිලිනොච්චි සමීක්ෂණය ගෙවිය යුතු | | 32,929.41 | - | - |
| | | **1,469,607.37** | **380,868.74** | **222,700.00** |
| <u>**කෙටි කාලීන ප්‍රතිපාදන**</u> | **8** | | | |
| විගණන ගාස්තු - 2011 | | - | 85,000.00 | - |
| විගණන ගාස්තු - 2012 | | 85,000.00 | 85,000.00 | - |
| විගණන ගාස්තු - 2013 | | 85,000.00 | - | 85,000.00 |
| අඩමාන ණය සඳහා වෙන් කිරීම් | | 71,162.82 | - | - |
| | | **241,162.82** | **170,000.00** | **85,000.00** |
| <u>**සේවක ප්‍රතිලාභ**</u> | **9** | | | |
| පාරිතෝෂික ප්‍රතිපාදන | | 1,160,263.00 | 979,054.40 | 1,160,263.00 |
| | | **1,160,263.00** | **979,054.40** | **1,160,263.00** |

| | සටහන | 2013 | 2012 | අයවැයගත |
|---|---|---|---|---|
| **රාජ්‍ය ප්‍රදාන - පුනරාවර්තන** | 10 | **13,780,000.00** | **9,350,000.00** | **14,000,000.00** |
| <u>**රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන**</u> | 11 | | | |
| රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන | | 7,294,073.48 | 10,003,639.03 | 8,530,000.00 |
| නාමික ක්ෂය කිරීම් ආදායම | | 4,301,474.74 | 3,648,308.37 | 4,318,000.00 |
| | | **11,595,548.22** | **13,651,947.40** | **12,848,000.00** |
| **වත්කම් අපහරණ ලාභය** | 12 | **13,085.00** | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **<u>අනිකුත් ආදායම</u>** | 13 | | | |
| වෙනත් ආදායම් | | 16,700.00 | 24,742.00 | 21,000.00 |
| ආපදා ණය පොළිය | | 50,816.85 | 60,348.25 | 50,000.00 |
| | | **67,516.85** | **85,090.25** | **71,000.00** |

| | | | | |
|---|---|---|---|---|
| **<u>වේතන, වැටුප් සහ සේවක ප්‍රතිලාභ</u>** | 14 | | | |
| වැටුප් සහ වේතන | | 4,815,399.69 | 2,613,984.41 | 5,010,000.00 |
| වැඩබැලීම් වැටුප් | | 20,524.98 | 89,636.32 | 21,000.00 |
| විශේෂ දීමනාව | | 723,276.32 | 327,597.66 | 737,000.00 |
| ජීවන වියදම් දීමනාව | | 1,601,947.75 | 847,683.87 | 1,562,000.00 |
| ප්‍රවාහන දීමනාව | | 180,000.00 | - | 180,000.00 |
| ඉන්ධන දීමනාව | | 334,000.00 | 212,400.00 | 334,000.00 |
| සේ.අ.සා.අ. | | 785,139.39 | 406,834.73 | 798,000.00 |
| සේ.භා.අ. | | 196,285.03 | 101,708.67 | 200,000.00 |
| අතිකාල | | 107,184.88 | 87,739.32 | 120,000.00 |
| නිවාඩු දින ගෙවීම | | 16,739.50 | 5,866.00 | 18,000.00 |
| තාවකාලික වැටුප් | | 363,331.56 | 161,000.00 | 150,000.00 |
| පාරිතෝෂික වියදම් | | 181,208.60 | 88,268.52 | 181,208.60 |
| | | **9,325,037.70** | **4,942,719.50** | **9,311,208.60** |

| | | | | |
|---|---|---|---|---|
| **<u>ප්‍රධාන සහ අනෙකුත් නොඉපයූ ගෙවීම්</u>** | | | | |
| | 15 | | | |
| පොදු වෘත්තීය මාර්ගෝපදේශන පද්ධතියක් ගොඩනැගීම | | 532,275.00 | - | 550,000.00 |
| කිළිනොච්චි සමීක්ෂණය | | 1,473,061.05 | - | 1,500,000.00 |
| මානව සම්පත් වැඩසටහන | | 492,567.00 | - | 500,000.00 |
| පුවත්පත් ලිපිය | | 65,500.00 | - | 80,000.00 |
| දැයට කිරුළ ප්‍රදර්ශනය | | 1,347,567.38 | - | 1,450,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| ශ්‍රම වෙළඳපල අධ්‍යයනය | | 250,657.75 | - | 500,000.00 |
| දත්ත පද්ධතියක් ස්ථාපනය | | 824,663.16 | - | 1,050,000.00 |
| උපාධිධාරී පුහුණු අධ්‍යයනය | | 437,978.46 | - | 500,000.00 |
| වෘත්තීය මාර්ගෝපදේශනය | | 1,810,879.71 | - | 2,300,000.00 |
| කාර්ය මණ්ඩල පුහුණුව සහ සංවර්ධනය | | 99,000.00 | 12,000.00 | 100,000.00 |
| අධ්‍යයනයන්/සමීක්ෂණ/විමර්ශන/පර්යේෂණ | | - | 375,253.00 | - |
| සම්මන්ත්‍රණ/ වැඩමුළු | | - | 2,185,435.68 | - |
| මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ව්‍යාපෘති | | - | 7,373,538.75 | - |
| ප්‍රකාශන | | - | 69,411.60 | - |
| | | **7,334,149.51** | **10,015,639.03** | **8,530,000.00** |
| **සැපයුම් සහ භාවිතා කළ පාරිභෝගික භාණ්ඩ** | 16 | | | |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය උපකරණ | | 107,726.52 | 200,319.47 | 130,000.00 |
| ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය | | 207,260.00 | 234,602.00 | 240,000.00 |
| නිල ඇඳුම් | | 27,650.00 | - | 25,000.00 |
| | | **342,636.52** | **434,921.47** | **395,000.00** |
| **ක්ෂයකිරීම් සහ ක්‍රමක්ෂක වියදම්** | 6 | **4,318,600.74** | **4,003,384.37** | **4,400,000.00** |
| **ප්‍රවාහන, යැපුම් සහ දීමනා** | 17 | | | |
| දේශීය ප්‍රවාහන සහ යැපුම් | | 37,520.00 | 74,087.50 | 50,000.00 |
| විගණන සාමාජිකයින් සඳහා දීමනා | | 84,400.00 | 54,400.00 | 73,600.00 |
| මණ්ඩල සාමාජික දීමනා | | 186,800.00 | 181,600.00 | 240,000.00 |
| | | **308,720.00** | **310,087.50** | **363,600.00** |
| **උපයෝගීතාව සහ සේවාවන්** | 18 | | | |
| වරිපණම් | | 39,199.97 | 43,555.52 | 39,200.00 |

| | | | | |
|---|---|---|---|---|
| විදුලිය | | 579,465.92 | 887,272.97 | 700,000.00 |
| ජලය | | 31,839.73 | 36,367.65 | 89,300.00 |
| දුරකතන ගාස්තු සහ බදුකුලී | | 171,843.68 | 195,975.42 | 170,000.00 |
| තැපැල් සහ ටෙලෙක්ස් ගාස්තු | | 24,400.00 | 8,265.00 | 25,000.00 |
| මුරකරු සේවාව | | 206,146.21 | 151,931.64 | 206,100.00 |
| වෙළඳ දැන්වීම් | | 103,084.80 | - | 100,000.00 |
| ආරක්ෂක සේවාව | | 518,010.00 | 383,940.00 | 455,400.00 |
| අන්තර්ජාලය | | 78,949.86 | 108,561.20 | 53,900.00 |
| අනිකුත් උපයෝජතාව සහ අනෙකුත් සේවාවන් | | 271,865.83 | 249,083.08 | 300,000.00 |
| | | **2,024,806.00** | **2,064,952.48** | **2,138,900.00** |
| **නඩත්තු වියදම්** | 19 | | | |
| ගොඩනැගිලි සහ ආකෘති අලුත්වැඩියාව සහ නඩත්තුව | | | 8,256.43 | - |
| පිරියත උපකරණ අලුත්වැඩියාව සහ නඩත්තුව | | 251,557.32 | - | 297,900.00 |
| වාහන අලුත්වැඩියාව සහ නඩත්තුව | | 636,054.86 | 529,643.34 | 670,500.00 |
| කාර්යාලිය උපකරණ අලුත්වැඩියාව සහ නඩත්තුව | | 192,727.60 | 486,074.93 | 205,100.00 |
| පරිගණක අලුත්වැඩියාව සහ නඩත්තුව | | 61,944.80 | 37,934.60 | 200,000.00 |
| විදුලි උපකරණ අලුත්වැඩියාව සහ නඩත්තුව | | 12,386.00 | 10,910.00 | 54,400.00 |
| | | **1,154,670.58** | **1,072,819.30** | **1,427,900.00** |
| **අනෙකුත් වියදම්** | 20 | | | |
| විගණන විමසුම | | 79,289.00 | 85,000.00 | 164,289.00 |
| පුවත්පත | | 14,000.00 | 16,760.00 | 13,920.00 |
| කාර්ය මණ්ඩල සුභසාධනය | | 43,101.00 | | 43,000.00 |
| අනෙකුත් සේවා වියදම් | | 39,659.75 | 136,551.00 | 38,000.00 |
| සංග්‍රහ කටයුතු | | 107,655.00 | 112,261.00 | 110,000.00 |
| අඩමාන ණය- නිමල් බෝපගේ | | 71,162.82 | - | - |
| | | **354,867.57** | **350,572.00** | **369,209.00** |

**ගිණුම්කරන ප්‍රතිපත්තීන් සහ අනිකුත් පැහැදිලි කිරීම් වල සාරාංශයකින් සමන්විත සටහන්**

**1.** 1997 අංක 18 දරන පනත යටතේ ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව ස්ථාපනය කරන ලදී. ආයතනයට පැවරී ඇති බලතල යටතේ එය මානව සම්පත් සංවර්ධනයට අදාළ සියලුම ක්‍රියාවන් සඳහා ප්‍රමුඛත්වය දෙන අතර මානව සම්පත් සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරයි.

**2. මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා ගිණුම් ඉදිරිපත්කිරීම සහ අවසරදීම**

(1971 අංක 38) දරන මුදල් පනතේ අංක 14 වගන්තියට අනුව, ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව රාජ්‍ය සංස්ථාවක් ලෙස වර්ෂය තුළ එහි බලතල, කාර්යභාරයන් සහ රාජකාරි ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම සහ සිදුකිරීම මෙන්ම ප්‍රතිපත්ති සහ වැඩසටහන් ක්‍රියාවට නැංවීම පිළිබඳ එහි සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම වාර්ෂික වාර්තාවක කෙටුම්පතක් පිළියෙල කරනු ලබයි. වර්ෂය තුළදී අදාළ අමාත්‍යවරයා විසින් සංස්ථාවට ලබාදුන් ඕනෑම නියෝගයක් එවැනි වාර්තාවක දක්වනු ලබයි. එවැනි වාර්තාවක පිටපත් සෑම වසරක් අවසානයේදීම මාස හතරක් ඇතුළත අදාළ අමාත්‍යවරයාට, සහ මුදල් අමාත්‍යවරයාට (ඔහු අදාළ අමාත්‍යවරයා නොවන්නේ නම්), ක්‍රම සම්පාදන අමාත්‍යවරයාට සහ විගණකාධිපතිවරයාට ඉදිරිපත් කරනු ලබයි.

1971 අංක 38 දරණ මුදල් පනතේ අංක 14 වගන්තියට අනුව, සියලුම මූල්‍ය වර්ෂයක් සඳහා වන රාජ්‍ය සංස්ථාවකම ගිණුම්, ගිණුම් සම්බන්ධ වෙනත් යම් වාර්තා ද සමඟින් එකී වර්ෂය සමාප්ත වීමෙන් පසු සිව් මසක් ඇතුලත විගණකාධිපතිවරයා විසින් නිශ්චිතව දක්වා සිටින ආකාරයෙන් විගණනය සඳහා ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. මෙකී උප වගන්තියේ පූර්වගාමී විධිවිධානවලට පටහැනිවන හෝ ඒ හා අනුකූලවීමට අපොහොසත්වන එවන් ඕනෑම සංස්ථාවක් මෙම පනත යටතේ වරදකරුවෙක් වන අතර, මහේස්ත්‍රාත්වරයෙක් ඉදිරියේ පවත්වනු ලබන ලඝු සමේෂණයකින් අනතුරුව රුපියල් දහස ඉක්මවා නොයන දණ්ඩනයකට යටත් වනු ඇත.

**3. අනුකූලතා ප්‍රකාශනය**

ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවේ ගිණුම්කරන සාම්ප්‍රදාය ශ්‍රී ලංකා වරලත් ගනකාධිකාරි ආයතනය මඟින් ප්‍රකාශයට පත්කරනු ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූල වේ.

## 4. මිණුම් පදනම

යම් යම් ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්, කාර්යාලීය උපකරණ, විද්‍යුත් සවිකිරීම් සහ උපකරණ, පරිගණක, වාහන සහ අනෙකුත් වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2008 සහ 2011 යන වසරවල සිදු කරන ලද ප්‍රත්‍යාගණනයන් හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබයි.

## 5. වත්කම් ආගණනයේ පදනම

**5.1** දේපල, පිරියත සහ උපකරණ වල අගය සඳහන් කරනු ලබන්නේ පිරිවැය/ආගණන වටිනාකමින් සමුච්චිත ක්ෂයකිරීම් අඩුකළ පසු ලැබෙන අගයයි.

**5.2** සියලුම දේපල, පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් ක්ෂයකිරීම ඇස්තමේන්තුගත සඵල ආයුකාලයට අදාළව පිරිවැය කපා හැරීම සඳහා ආරෝපණය කරනු ලබයි.

**5.3** මිළදී ගත් වර්ෂය සඳහා ක්ෂය කිරීම් සිදු නොකරන අතර, 2009 වසරට පෙර මිළදී ගත් වත්කම් සම්බන්ධයෙන් අපහරණ වසරේදී පූර්ණ ක්ෂය කිරීම සිදුකරන අතර, 2009 වසරේ සිට ක්ෂය කිරීම් ගණනය කර ඇත්තේ සෑම වත්කමකම මිළදී ගත් දිනය/අපහරණ දිනය පදනම් කොට ගෙනය.

**5.4** පාරිභෝගික භාණ්ඩ ගබඩා මණිනු ලබන්නේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි කළ හැකි වටිනාකම යන දෙකින් අඩු අගයකටය.

## 6. ක්ෂය කිරීම

වත්කම් පන්තීන් සහ ක්ෂය කිරීම් අනුපාතිකයන් පහත පරිදි වේ. වත්කම් පන්තීන් තීරණය කරනු ලබන්නේ ආස්ථිතියෙහි ඒවායේ ස්වභාවය සහ භාවිතයට අනුවය.

| | |
|---|---|
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් | 2.5% |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 10% |
| කාර්යාලීය උපකරණ | 10% |
| විද්‍යුත් සවිකිරීම් සහ උපකරණ | 20% |
| පරිගණක | 20% |
| පරිගණක මෘදුකාංග | 25% |
| වාහන | 20% |
| පොත් | 10% |
| අනිකුත් වත්කම් | 10% |

**7. සන්සන්දනාත්මක සංඛ්‍යා**

පසුගිය මූල්‍ය වර්ෂයේ සංඛ්‍යා ප්‍රති වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවල තුලනාත්මකබව ඇති කිරීම පිණිස අනුකූලනය කර තිබේ.

**8. වාර්තා කරන දිනෙන් පසු සිදුවීම්**

සියලුම භෞතික ශේෂපත්‍ර සිදුවීම් සැලකිල්ලට ගෙන ඒ සඳහා යෝග්‍ය අනුකූලනයන් සිදුකිරීම හෝ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණයන් සිදුකර ඇත.

**9. ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවේ ක්‍රියාවන් අඛණ්ඩව සිදුකිරීම**

අගෝස්තු අංක 2 දරන සභාවෙහි නිර්දේශය පරිදි " රැකියා පිරි සැකසුම සම්බන්ධ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම". සම්බන්ධ ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව ක්‍රියාව අත්හිටුවන ලදී. ඉහත ක්‍රියාවලීන් සඳහා වෙන්කරන ලද ශේෂ ප්‍රාග්ධන වියදම 2013 සංශෝධිත අයවැය හරහා අනිකුත් කාර්යයන්ට නැවත වෙන් කරන ලදී.

**10. රාජ්‍ය ප්‍රදාන සම්බන්ධ ගිණුම්කරණය**

මහා භාණ්ඩාගාරයෙන් ලැබුනු පුනරාවර්තන ප්‍රදාන සහ ප්‍රාග්ධන ප්‍රධාන පිළිවෙලින් ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවෙහි පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සපුරාලීම පිණිස යොදා ගන්නා ලදී. ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවෙහි කාර්යයන් සම්බන්ධයෙන් දරන ලද මුදල වසර තුළ අයකරන ලද ක්ෂය කිරීමට සමාන මුදලක් ප්‍රාග්ධන වත්කම්හි සඵල ආයුකාලය පුරා ක්‍රමානුකූල පදනමින් ආදායමක් ලෙස හඳුනාගනු ලබයි.

**11. විශ්‍රාම ගැන්වීම් ප්‍රතිලාභ පිරිවැය**

**11.1 අර්ථ දක්වන ලද දායකත්ව සැලැස්ම– සේ.අ.අ සහ සේ. භා.අ**

සේවක අර්ථසාධක අරමුදලෙහි දායකත්වයට සහ සේවක භාරකාර අරමුදලෙහි දායකත්වයට සුදුසුකම් ලබන සියලුම සේවකයින් ප්‍රතිග්‍රාහී ව්‍යවස්ථා සහ රෙගුලාසි යටතේ අදාළ දායක අරමුදල් මඟින් ආවරණය කරනු ලබයි.

**11.2 විශ්‍රාමික පාරිතෝෂික**


අංක 19 දරන LKAS " සේවක ප්‍රතිලාභ" වලට අනුකූලව, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවීමට නියමිත විශ්‍රාමික පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. විශ්‍රාමික බැරකම් සඳහා බාහිර වශයෙන් අරමුදල් සැපයීම හෝ ආයුගණක වශයෙන් ඇගයීම සිදුකරනු නොලබයි.


**12. මූල්‍ය කාර්යසාධනය**

සභාවෙහි මෙහෙයවීම් සහ එහි ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීම සඳහා දරනු ලබන සියලුම පිරිවැය සම්බන්ධයෙන් එය කාර්යක්ෂමව කටයුතු කර ඇති අතර ආදායම සඳහා අයකරනු ලැබ ඇත. ආදායම් වියදමෙහි හිඟය/අතිරික්තය කරා ළඟා වී ඇත්තේ සියලුම දැනුවත් වගකීම් සහ වත්කම් ක්ෂය කිරීම පිණිස ප්‍රතිපාදන සැපයීමෙන් පසුවය.

**13. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය**

අංක 2 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් වල 27 වන වගන්තිය මඟින් නිශ්චිතව දක්වා ඇති වක්‍ර ක්‍රමය යොදා ගනිමින් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනු ලබයි.



විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. : වයිඑස්/ඩී/ එන්එච්ආර්ඩීසී / 1/13/05

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2015 මාර්තු 11 දින

ජාතික මානව සම්පත් සංවර්ධන සභාව. 23 MAR 2015

සභාපති,

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව.

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතේ 24 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) ඒ වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපති වෙත 2014 සැප්තැම්බර් 03 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

02. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

ගිණුම්කරණ අඩුපාඩු

------------------------

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂයේ පුනරාවර්තන ප්‍රදාන යටතේ වියදම රු. 13,780,000 ක් වුවත් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එම ප්‍රමාණය රු. 13,966,566 ක් වී තිබුණි. ඒ අනුව භාණ්ඩාගාර මුද්‍රිත සටහන් හා ගිණුම් අතර රු. 186,566 ක වෙනසක් නිරූපණය වී තිබුණි.

(ආ) සම්පූර්ණ ක්ෂය කර තිබූ ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයේ පවතින පිරිවැය රු. 1,702,500 ක් වූ වත්කම් ඒකක 4 ක් ප්‍රත්‍යාගණනය කර වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3 ගෙවිය යුතු ගිණුම් හා ලැබිය යුතු ගිණුම්

(අ) ගෙවිය යුතු වියදම් අයිතම් 03 ක එකතුව රු. 73,097 ක් වසර 1 ත් 3 ත් අතර කාලපරිච්ඡේදයකට අයත් වූවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ආ) සභාවේ සභාපති ලෙස සේවය කරන ලද නිලධාරියෙකුගෙන් අයකළ යුතුව ඇති රු. 71,162 ක මුදල විගණිත දිනය වූ 2014 අප්‍රේල් 02 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේදී සභාවේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු. 292,661 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 108,058 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 400,719 ක වර්ධනයක් නිරීක්ෂණය විය. රජයේ පුනරාවර්තන ප්‍රදාන රු. මිලියන 4.4 කින් වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

කෙසේ වූවද පිළිගත හැකි සාධාරණ හේතුවකින් තොරව සභාවේ ආරක්ෂක කටයුතු සඳහා මාසිකව දරන ලද වියදම 2013 ඔක්තෝබර් මාසයේ සිට සියයට 88 කින්ද, සනීපාරක්ෂක සේවා කටයුතු වෙනුවෙන් දරන ලද වියදම 2013 ජූලි මාසයේ සිට සියයට 49 කින්ද වැඩිවී තිබූ බව නිරීක්ෂණය විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතෙහි 14(1) ඡේදය යටතේ සභාවෙහි කාර්යය සහ කර්තව්‍යයන් 6 ක් දක්වා ඇත. එහෙත් පසුගිය කාල පරිච්ඡේදයට අදාල සැලසුම් මෙන්ම එහි සත්‍ය ක්‍රියාකාරීත්වය තුළ පනතෙහි සඳහන් පරිදි මෙම ආයතනය ආරම්භ කිරීමේ මූලික අරමුණ ඉටුකිරීම කෙරෙහි අවධානය යොමුකර නොමැති බව පහත කරුණු අනුව නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි වැඩසටහන් 10 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ නමුත් ඒ තුළින් පනතෙහි සඳහන් අරමුණු 06 න් 03 ක්ම ආවරණය වී නොතිබුණි.

(ආ) ඉහත සඳහන් වැඩසටහන් 10 සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදනය රු. 9,850,000 ක් වූ අතර රු. 7,230,000 ක් වැය කරමින් වැඩසටහන් 9 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එසේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් 9 න් අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවී තිබුණේ වැඩසටහන් 3 ක් පමණි.

4.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

සභාව ආරම්භ කිරීමේ අරමුණු වඩාත් ඵලදායීව ඉටුකර ගැනීම සඳහා එම පනතට අනුව සභාව වෙත පත්කළ යුතු සාමාජිකයන් රටෙහි ආර්ථික හා මානව සම්පත් සංවර්ධනය හා සම්බන්ධ ආයතනයන්හි ප්‍රධානීන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් වී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයයේදී සභාව වෙත පත්කළ සාමාජිකයින් 17 දෙනාගෙන් 04 දෙනෙකු පවත්වන ලද කිසිඳු රැස්වීමකට සහභාගී වී නොතිබුණි. සියළුම රැස්වීම් සඳහා සහභාගීවී තිබුණේ එක් සාමාජිකයකු පමණි. රැස්වීම් වාර 01 ක් සඳහා පමණක් සහභාගීවූ සංඛ්‍යාව 05 කි. එමෙන්ම පනතෙහි 3(1) වගන්තියෙහි (P) ප්‍රකාරව අමාත්‍යවරයා විසින් පත්කළ යුතු සාමාජිකයින් 03 දෙනෙකු පත්කර නොතිබුණි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාව විසින් පෞද්ගලික ආයතනයක් මඟින් රු. 257,500 ක මූලික වැයක් දරමින් 2011 සැප්තැම්බර් 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකාවේ රැකියා විරහිත වෘත්තිකයන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කර පවත්වාගෙන යාමට අවශ්‍ය මූලික කටයුතු සිදු කර ඒ සඳහා රු. 920,375 ක් වැයකර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම කටයුත්ත නිමකර නොතිබුණු අතර වැය කරන ලද සම්පූර්ණ මුදලම නිෂ්කාර්ය වී තිබුණි. මෙම වැඩසටහන අසාර්ථක වීම කෙරෙහි පහත සඳහන් හේතු බලපා තිබුණි.

I. විධිමත් ක්‍රමවේදයකින් තොරව පෞද්ගලික ආයතනයක් තෝරාගැනීම සහ එසේ තෝරාගත් ආයතනයට මෙම කාර්යය අඛණ්ඩව හා විධිමත්ව පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳ විධිමත් ඇගයීමක් සිදුකර නොතිබීම.

II. මීට අදාලව පෞද්ගලික සේවා ආයතනය සමඟ එළඹෙන ලද ගිවිසුම අවිධිමත් හා අසම්පූර්ණ එකක් වීම.

(ආ) උසස් අධ්‍යාපනය සඳහා වරම් නොලැබූ සිසුන් සවිබලගැන්වීම සඳහා වෘත්තීය අධ්‍යාපනයට යොමුකිරීම හා ඒ සඳහා ඇති බාධාවන් හඳුනාගැනීම සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස තෝරාගත් දිස්ත්‍රික්ක 05 ක සිසුන් සහභාගී කර දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ඒ සඳහා එකතුව රු. 1,810,879 ක් වැයකර තිබුණි. එහෙත් එම වැඩසටහන් තුළින් අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණු බව පහත සඳහන් කරුණු අනුව නිරීක්ෂණය විය.

i. මූලික වැඩසටහන සඳහා සිසුන් 1906 ක් සහභාගී වී තිබුණත් ඉන් සියයට 50 ක් පමණක් වෘත්තීය පාඨමාලා හැදෑරීම සඳහා වෘත්තීය පුහුණු ආයතන වෙත ලියාපදිංචි වී තිබුණි.

ii. තෝරාගත් දිස්ත්‍රික්ක 5 හි සියළුම ප්‍රදේශ ආවරණය වන පරිදි සිසුන් සහභාගී කරවීමේ අරමුණෙන් වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර තිබුණත් විගණන නියැදි පරීක්ෂාවට භාජනය වූ දිස්ත්‍රික්ක 4 ක පවත්වන ලද වැඩසටහන් සඳහා එම දිස්ත්‍රික්කයන්හි ප්‍රධාන නගර 4 ආශ්‍රිත ප්‍රදේශවලින් සිසුන් 438 ක් සහභාගී වී තිබුණත් ඉන් බැහැරව පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 කින් සිසුන් 25 ක් පමණක් සහභාගී වී ඇති බව නිරීක්ෂණය විය. එමෙන්ම වැඩසටහන පවත්වන ලද දිස්ත්‍රික්ක 03 ක වැඩසටහන පැවැත්වෙන දිනට වෘත්තීය පුහුණුව සඳහා විවිධ ආයතන වෙත ලියාපදිංචි වූ සිසුන් 400 කින් සිසුන් 355 ක් වෘත්තීය පුහුණු පාඨමාලාවන් සඳහා සහභාගී වී නොතිබුණු බව අනාවරණය විය.

## 5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

-----------------------------------------

### 5.1 සංයුක්ත සැලැස්ම

-------------------

2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 උපඡේදය පරිදි පූර්ව තෙවර්ෂයේ මෙහෙයුම් පිළිබඳව සමාලෝචනයක් වර්ෂ 2013 සිට 2017 දක්වා කාලසීමාවට සකස් කළ සංයුක්ත සැලැස්මෙහි අන්තර්ගතව නොතිබුණි. එමෙන්ම මූදුන් පමුණුවා ගතයුතු ඉලක්කයන්හි මූල්‍යමය අගයක් දක්වා නොතිබුණු බැවින් වාර්ෂික ප්‍රගතිය මූල්‍යමය වශයෙන් සංසන්දනය කළ නොහැකි විය.

### 5.2 අභ්‍යන්තර විගණනය

----------------------

සභාව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මකව නොතිබුණු අතර රේඛීය අමාත්‍යාංශය වූ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් සභාවේ කටයුතු විගණනයට භාජනය කර තිබුණි.

6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ප්‍රසම්පාදනය

(ආ) ගිණුම්කරණය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

විගණකාධිපති,

විගණකාධිපති දෙපාර්තමේන්තුව,

පොල්දූව පාර,
බත්තරමුල්ල.

**<u>මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>**

ඔබගේ අංක වයි එස්/ඩී/එන් එච් ආර් ඩී සී/1/13/05 හා 2014 සැප්තැම්බර් 10 දිනැති ලිපියෙන් ඉදිරිපත් කරන ලද උක්ත වාර්තාව හා බැඳේ. ඒ අනුව පැහැදිලි කිරීම පහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම</u>

අ) වෙනස පිළිබඳ සොයා බලා නිවරදි කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

ආ) එකඟ වේ.

පොත් අගය ශූන්‍ය වූ එලදායී ජීව කාලයක් පවතින වත්කම් ප්‍රත්‍යාගණනය කර අදාල වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.3 <u>ගෙවිය යුතු ගිණුම් හා ලැබිය යුතු ගිණුම්</u>

අ ) <u>ගෙවිය යුතු ගිණුම්</u>

එකඟ වේ.

වසර 1 ත් 3 ත් අතර පරාසයක පවතින ගෙවිය යුතු වියදම් වලින් රු.48,097.63/- ක වියදම ගිණුම් වලින් ඉවත් කිරීමට පාලක මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අතර අවශ්‍ය ගැලපීම් 2014 වර්ෂයේ අවසාන ගිණුම් තුල සිදු කර ඇත. ඉතිරි වියදම් පිළිබඳ සොයා බලා අදාල හිමිකම් ඇති පාර්ශව වෙත ගෙවීමට හෝ පාලක මණ්ඩලයේ අවසර ඇතිව ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

ආ) <u>ලැබිය යුතු ගිණුම්</u>

එකඟ වේ.

හිටපු සභාපතිවරයාගෙන් අයවිය යුතු රු71,162.82 ක මුදල අයකර ගැනීම වෙනුවෙන් පිළිගත් ආයතන ක්‍රියාපටිපාටිවලට අනුව යමින් සිහිකැඳවීමේ ලිපි යැවීම, එන්තර වාසි යැවීම සහ සමථ මණ්ඩලයට යොමු කිරීමෙන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම යන කටයුතු කාල පමාවකින් තොරව සිදුකර ඇත. මේ පිළිබඳව යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැති බැවින් අධිකරණ ක්‍රියාමාර්ග සිදු කරමින් පවතී.

4. <u>මූල්‍ය සමාලෝචනය</u>

<u>මූල්‍ය ප්‍රතිඵල</u>

එකඟ වේ.

නිපුණතා පියසේ ආරක්ෂක සේවා කොන්ත්‍රාතුව සහ සනීපාරක්ෂක සේවා කොන්ත්‍රාතුව පිරිනැමීමට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදු කරනු ලබනුයේ තරුණ කටයුතු අමාත්‍යාංශය විසිනි. අමාත්‍යාංශයේ 2013.09.09 දිනැති ලිපි අංක 2-3/03/22 මගින් සහ 2013/02/26 දිනැති ලිපි අංක **02-03/03/21** මගින් අප ආයතනය විසින් එම සේවා ලබා ගැනීම වෙනුවෙන් දැරිය යුතු ගාස්තු ප්‍රමාණ දන්වා එවා ඇත. උක්ත ප්‍රසම්පාදන කටයුතු අප පාලනයෙන් බැහැර කරුණක් බැවින් මිල වැඩි වීම පිළිබඳ වැඩිදුර තොරතුරු අප ආයතනයට ලබා දීම අපහසු වේ.

4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

4.1 කාර්යසාධනය

එකඟ නොවේ.

පනතේ දක්වා ඇති අරමුණු 6 ම ආවරණය වන පරිදි වැඩසටහන් සකස්කර ක්‍රියාත්මක කිරීම, පනතේ අරමුණුවල ස්වභාවය සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳ සොයා බැලීමේදී 2013.06.30 දින දක්වා සිටි 9 දෙනෙකුගෙන් යුතු සුළු කාර්ය මණ්ඩලය සමඟ ප්‍රායෝගිකව පහසු කටයුත්තක් නොවිය. නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමෙන් පසු පනතේ 14 (1) ඡේදයේ දැක්වෙන කාර්යයන් සිදු කිරීමට කටයුතු කරන ලදි. 2013 වර්ෂයේදී පනතේ අරමුණුවල එන මුල් අරමුණෙහි එන උප අරමුණු ආවරණය වන පරිදි ක්‍රියාකාරි සැලැස්ම සකස්කර ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව මෙම ආයතනය ආරම්භ කිරීමේ මූලික අරමුණ ඉටුකිරීම කෙරෙහි අවධානය යොමු කර නොමැතිය යන්නට එකඟ විය නොහැක.

අ ) එකඟ නොවේ.

එකඟ නොවීමට හේතු පහත පරිදි අරමුණට ඉදිරියෙන් දක්වා ඇත.

14 (I) 1වන අරමුණ: මුල් අරමුණෙහි එන උප අරමුණු ආවරණය වන පරිදි ක්‍රියාකාරි සැලැස්ම සකස්කර ක්‍රියාත්මක කර ඇත.

14 (i) 2 වන අරමුණ: ජාතික ප්‍රතිපත්තියට අනුකූල වූ මානව සම්පත් සංවර්ධනය කිරීමේ සැලැස්ම දැනට ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ලේකම් කාර්යාලයෙන් ඉදිරිපත් කර කැබිනට් අනුමැතිය ලබා ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. ඒ අනුව අප ආයතනයෙන් ජාතික මානව සම්පත් සැලැස්මක් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

14 (i) 3 වන අරමුණ : ඉහත සඳහන් කල ජාතික මානව සම්පත් ප්‍රතිපත්තිය මෙතෙක් ක්‍රියාකාරී මට්ටමේ නොමැති බැවින් ඒ පිළිබඳ සමාලෝචනය කිරීමට මෙම වර්ෂයේදී අවස්ථාවක් නොලැබුණි.

14 (i) 4 වන අරමුණ : ආණ්ඩුව විසින් අනුමත කල මානව සම්පත් සංවර්ධන සැලසුමක් වන "උපාධිධාරීන් රාජ්‍ය සේවයට බඳවාගැනීමේ සැලසුම හා එය ක්‍රියාත්මක කිරීම" පිළිබඳ සොයා බැලීම් සිදුකල ව්‍යාපෘතියක් වන උපාධිධාරීන් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ ඵලදායිතාවය සෙවීම සම්බන්ධ සමීක්ෂණය පනතේ 14.1 (I) සහ 4 වන ඡේදයේ අරමුණද ආවරණය කල පොදු වැඩසටහනක් ලෙස සාර්ථකව ක්‍රියාත්මක කරන ලදි.

14 (i) 5 වන අරමුණ : පනතේ 1 වන උප ලේඛනයේ 2.2 විෂය සහ අංක 5 විෂය ආවරණය කල පොදු වැඩසටහන් ලෙස පිළිවෙලින් "වෘත්තීය මාර්ගෝපදේශණ අධ්‍යයනය" සහ "කිළිනොච්චි දිස්ත්‍රික්කයේ යුද්ධයෙන් අවතැන් වූ අවාසිකර තත්වයට පත්වූ පවුල්වල අවශ්‍යතා හඳුනාගැනීමේ සමීක්ෂණය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදි.

14 (i) 6 වන අරමුණ : ජාතික අරමුණකට අනුකූලව ක්‍රියාත්මක කෙරෙන "දැයට කිරුළ" ජාතික වැඩසටහන යටතේ අප සභාව විසින් මානව සම්පත් සංවර්ධනය කිරීමට අවශ්‍යයයි අපේක්ෂා කරන ලද මානව සම්පත් සංවර්ධන වැඩසටහන් 4 ක් ක්‍රියාත්මක කරන ලදි.

ආ) එකඟ නොවේ.

2013 වර්ෂය සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් අතර වැඩසටහන් 8 ක් ආයතනයේ අරමුණු හා පරමාර්ථ කෙරෙහි සෘජු දායකත්වයක් දක්වා තිබු වැඩසටහන් වේ. ඉතිරි වැඩසටහන වනුයේ වාර්ෂිකව පවත්වනු ලබන දැයට කිරුළ වැඩසටහන වේ. උක්ත සඳහන් කල වැඩසටහන් අටෙන් එක් වැඩසටහනක් පමණක් ලංසු ඉදිරිපත් නොවීම මත 2013 වර්ෂයේදී ක්‍රියාත්මක නොකරන ලදි. ඒ අනුව ක්‍රියාත්මක කල සෑම ව්‍යාපෘතියකම ඉලක්කයන් 2013 වර්ෂයේ ප්‍රතිපාදන ලැබීමේ සීමාවන්ට යටත්ව සතුටුදායක ලෙස ලඟාකර ගෙන ඇත.

4.2 <u>කළමණාකරන අකාර්යක්ෂමතා</u>

එකඟ වේ.

මෙම ආයතනයේ පාලක මණ්ඩල සාමාජිකයින් 11 දෙනෙකු අමාත්‍යාංශ ලේකම්වරු වන අතර සභාපතිවරු 4 ක් ද වේ. එබැවින් කාර්ය බහුල එවැනි නිලධාරීන් නිතිපතා පාලක මණ්ඩල රැස්වීම්වලට සහභාගීවීම ප්‍රායෝගික අපේක්ෂා කළ නොහැකි තත්ත්වයකි. කෙසේ වුවද පවත්නා තත්ත්වය අනුව පාලක මණ්ඩල තීරණය පරිදි ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි සභාවේ සාමාජිකත්වය උපරිම ලෙස දායක කර ගැනීමට ලබා ගැනීමට හැකි වන

පරිදි පාලක මණ්ඩල සාමාජිකයන් පිළිබඳ පනතේ විධිවිධාන සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

4.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතාව</u>

අ ) පෙර වර්ෂවලදී රැකියා විරහිත වෘත්තිකයන්ගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යාම පිළිබඳ කටයුතු සැලසුම්කර ක්‍රියාත්මක කිරීමේ ගැටළු පැවතියද 2013 වර්ෂයේදී සභාව විසින් මේ පිළිබඳ වගකිව යුතු නිළධාරීන් සම්බන්ධයෙන් පහත පරිදි ක්‍රියාමාර්ග ගන්නා ලදි. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව සහ පියෝටෙල් ලංකා පුද්ගලික සමාගම අතර ඇතිකර ගත් අවබෝධතා ගිවිසුමේ 12 වන වගන්තිය ප්‍රකාරව 2013 වසරේදී ආයතනය විසින් බේරුම්කරුවෙකු පත්කරන ලෙස එම සමාගමේ සභාපති පට්ටියවෙල මහින්ද හිමි වෙත 2013-06-05 වන දින ලිපියකින් දැනුම් දී ඇත. ඒ පිළිබඳව 2013/07/08, 2013/08/27 හා 2013/10/19 දිනයන්හි සිහිකැඳවීමේ ලිපිද යොමු කරමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. මේ සඳහා ප්‍රතිචාර ලැබී නොමැති බැවින් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත මේ පිළිබඳව පැමිණිලි කර ඇත.

ආ)

i. එකග නොවෙමි

සහභාගි වූ මුළු සංඛ්‍යාව 2930ක් වන අතර එදින ලියාපදිංචි වූ සංඛ්‍යාව 1871 කි.

ii. විගණන නියැදි පරීක්ෂාවට භාජනය වූ රත්නපුර, කෑගල්ල, පුත්තලම හා කුරුණෑගල යන දිස්ත්‍රික්කයන්හි සිසු සහභාගිත්වය 1202 කි.

මෙම වැඩසටහන පිළිබඳව එම වැඩසටහන පැවැත්වීමට ප්‍රථම අදාල සියළුම පුහුණු ආයතන, දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් හා එහි සේවයේ නියුතු නිපුණතා සංවර්ධන නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්, තරුණසේවා නිලධාරීන් අ.පො.ස(සා.පෙළ) හා අ.පො.ස.(උසස් පෙළ) හැදෑරූ සිසුන් මෙම වැඩමුළුව සඳහා සහභාගි කරවන ලෙස දැනුවත් කර ඇත. මෙයට අමතරව වැඩමුළුව සම්බන්ධ තොරතුරු ඇතුලත් පෝස්ටරයක් සෑම ග්‍රාම නිලධාරි වසමකම ප්‍රදර්ශනය කරන ලෙස සියළුම ග්‍රාම නිලධාරීන් වෙත යවන ලදී. තවද විභාග දෙපාර්තමේන්තුවෙන් ලබාගත් 2012 වර්ෂයේදී සා.පෙළ හා උ.පෙළ අසමත් සිසුන්ගේ විස්තර ඇතුලත් නාමලේඛනය අනුව සියළුම සිසුන්ට පෞද්ගලිකවම ලිපියක් මගින් දැනුවත් කරන ලදී.

මේ පිළිබඳව නිපුණතා සංවර්ධන නිලධාරීන්ගෙන් විමසූ විට පැවසුවේ ඇත පෙදෙස්වලින් සහභාගිත්වය අවම වී ඇත්තේ ප්‍රවාහන අපහසුකම් නිසා බවය. තවද, නගරයෙන් බැහැර පිහිටි ප්‍රදේශයන් වල සිසුන්ගේ සහභාගිත්වය අවම වීම සාමාන්‍යයෙන් දක්නට ලැබෙන ප්‍රායෝගික තත්වයකි.

කෑගල්ල, මාතර හා රත්නපුර යන දිස්ත්‍රික්කයන්හි පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වූ සංඛ්‍යාව 745 වන අතර පාඨමාල හදාරණ සංඛ්‍යාව 89කි.

එමෙන්ම වෘත්තීය පුහුණුවට එම ආයතන මගින් වර්ෂය පුරාම බඳවා ගැනීම සිදු නොකරන අතර බොහෝවිට වර්ෂය ආරම්භයේදී සිදුකරන බැවින් ඉදිරියේදීද බඳවා ගැනීම් සිදු කිරීමට ඉඩ ඇත. තවද සමහර ආයතනවල පවතින සීමිත ඉඩකඩ, උපකරණ හා උපදේශක හිඟය වැනි කරුණු මත පසුකාලීනව සිසුන් බඳවා ගැනීමට හැකියාව ඇති හෙයින් එවැනි සිසුන්ගේ තොරතුරු මෙම සංඛ්‍යා ලේඛනවලට ඇතුලත් වී නොමැත. මෙවැනි වැඩසටහනක ප්‍රතිඵල එක් අවුරුද්දක සංඛ්‍යා ලේඛන මත පමණක් තීරණය කිරීම ප්‍රායෝගික නොවන අතර එම ප්‍රතිඵල දීර්ඝ කාලයක් තුල මැනීම කාලෝචිතය.

මෙම වැඩසටහන් පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කිරීමට පමණක් සීමා නොවූ අතර, මීට අමතරව මාතර, රත්නපුරය, කෑගල්ල, කුරුණෑගල හා පුත්තලම යන දිස්ත්‍රික්කයන්හි පැවැති වැඩමුළු වලදී ප්‍රශ්නාවලියක් ඇසුරින් අධ්‍යනයක් සිදු කෙරුණි. එහි අරමුණ වූයේ එම දිස්ත්‍රික්කවල පාසැල් හැර යන දරු දැරියන් මෙතෙක් වෘත්තීය අධ්‍යාපනයට යොමු නොවූ හේතු සොයා අමාත්‍යවරයාට නිර්දේශ සැපයීමය. එම අධ්‍යනයේ වාර්තාව මේ වනවිට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති ගරු ඇමතිතුමා වෙත ඉදිරිපත් කර ඇත.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම.

එකඟ වේ.

වර්ෂ 2014-2018 දක්වා කාල සීමාවට සකස් කරන සංයුක්ත සැලැස්මේ පූර්ව තෙවර්ෂයක මෙහෙයුම් පිළිබඳ සමාලෝචනයක් ඇතුලත් කිරීමට කටයුතු යොදන අතර මුදුන් පමුණුවා ගත යුතු ඉලක්කයන් හි මූල්‍යමය අගයන් නිශ්චිත වශයෙන් යෙදිය නොහැකි වුවද දළ වශයෙන් ඇතුලත් කර නිවරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

### 5.2 අභ්‍යන්තර විගණනය

එකඟ වේ.

සභාව තුල අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කිරීමට අභ්‍යන්තර විගණන නිළධාරීවරයෙක් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් මගේ අංක NHRDC/1/Rec/2012 හා 2012/10/05 දිනැති ලිපියෙන් රේඛීය අමාත්‍යාංශය මගින් ඉල්ලුම් කලද එම තනතුර අනුමත කර නැත. එම නිසා යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනය අංශය මගින් විගණන කටයුතු සිදු කරනු ලැබේ .

## 6. පද්ධති හා පාලන

විගණන පෙන්වා දීම් වලට අනුව අවශ්‍ය කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ.

විජය වික්‍රමරත්න

සභාපති